# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2559 මැදින් මස 22 වන කුජ දින

■ 2016 මාර්තු මස 22 වැනි අඟහරුවාද




■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි

■ විකිණීම සඳහා නොවේ

# මැදින් පුන් පොහොය දිනයේ වැදගත්කම





සිදුහත් තවුසාණන් බුදු බවට පත්වීමෙන් පසු කාළුදායී තෙරණුවනගේ මාර්ග සංවිධානයට අනුව ශාක්‍ය දේශය වූ නේපාලය බලා පිටත් වූයේ මැදින් පුර පසළොස්වක පොහොය දිනකය. විසි දහසකට අධික මහා සංඝ රත්නය සමග ශාක්‍ය දේශයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඥාතීන්ගේ මානය දුරුකිරීම සඳහා යමාමහ පෙළහර පෑවෝය. මෙදිනම ඓශ්චර්යමත්වූ වර්ෂාවක්ද ඇතිවූ නිසා එය පාදක කොටගෙන වෙස්සන්තර ජාතකය වදළහ. සුද්ධෝදන රජතුමන්ගේ තුන්වැනි වැඳීම සිදුවූයේද මේ අවස්ථාවේදීය.

බුදුන් වහන්සේ කිඹුල්වත්පුරට වැඩීමෙන් පසු සියලු සුඛ විහරණ අත්හැර අල්පේච්ඡ ජීවිතයට පත්ව සිටි යශෝධරාවන් බැහැ දුටු බුදුහාමුදුරුවෝ පසුගිය ආද්මය සිහිපත් කොට සඳකිඳුරු ජාතකය දේශනා කළහ.


බුදුහාමුදුරුවෝ කිඹුල්වතට වැඩීමෙන් පසුව තෙවනද සහ සත්වනද නන්ද කුමරුගේත්, රාහුල කුමරුගේත් පැවිද්ද සිදුවිය. මව්පිය අනුදැනුමක් නොමැතිව දරුවන් පැවිදි නොකළ යුතුය යන නීතිය අනුමත කරන ලද්දේත් මෙම පැවිදි කිරීම්වලින් පසුවය. ඉන්පසු බුදුන් වහන්සේ මල්ල රට අනුපිය අඹ වනයට පැමිණියහ. මෙහිදී සුදෙවුන් රජුගේ මෙහෙයවීමෙන් ශාක්‍ය කුමාරවරුන් විශාල පිරිසක් පැවිද්ද ලැබීය.

ලාංකික බෞද්ධ ජනතාව ශ්‍රී පාද වන්දනාව සඳහා වැඩි වශයෙන්ම එක් රොක්වන දවසත් මෙම මැදින් පුණු පොහෝ දවසය.

මේ අනුව මැදින් පොහොයෙහි වැදගත්කම ගැන කරුණු කැටි කොට බලන විට අපට නිගමනය කළ හැක්කේ එය බුදුන් වහන්සේගේ උපන් ගමට සහ නෑ හිත මිතුරන් වෙත කෘතගුණ දැක්වීම යොදගත් ඓතිහාසික මංගල පොහොයක් ලෙසටය.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැළණිය**

"මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# රූපියලක්වත් වියදම් නොකර ලස්සන වීමේ ක්‍රමයක්

ලොව පහළ වූ උත්තරීතරම මනුෂ්‍ය රත්නය වන ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව ඇති තතු ඒ ඒ පරිද්දෙන් අවබෝධ කරගත් සේක. ලොව වසන සෑම සත්වයකුගේම ආයුෂ, වර්ණ, සැප, බල ආදීන්ගේ විවිධ වූ විෂමතාවන්ට හේතුසාධක වන්නා වූ කරුණු කාරණා මෙන්ම එකී අඩුපාඩුකම් සකසා ඔවුන් බලාපොරොත්තු වන්නා වූ සැප සම්පත් ලබාගන්නා මාර්ගයද මහා කරුණාවෙන් ලොවට පෙන්වා දුන් සේක. ලොව වෙසෙන සෑම තරාතිරමකම කාන්තාවන් ස්වකීය රූ සපුව පිළිබඳව මහත් වූ උනන්දුවක් දක්වති. ඒ පිළිබඳ උනන්දුවක් නොදක්වන ස්ත්‍රියක් මෙලොව නැති තරම්ය. ඒ සඳහා නොයෙක් ආකාරයේ රූපලාවන්‍ය ක්‍රියාකාරකම්වලට මහත් සේ කාලය හා මුදල් යොදවති. එහෙත් ලොව ඇතැම් කාන්තාවන්ගේ රූප ශෝභාවය විවිධය. විෂමය. මීට හේතුව කුමක්ද? යන්න අද පමණක් නොව බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටි කාලයේදී පවා මෙම වෙනස්කම්වලට හේතු මොනවාද? යන්න සෙවීමට උනන්දු වී ඇති බව පෙනේ. කොසොල් මහරජතුමාගේ අගබිසව වන මල්ලිකා දේවිය විසින් කාන්තාවන්ට සුවිශේෂී වූ රූ සපුව හා ඔවුන්ගේ ජීවිතයන්හි විෂමතාවන්ට අදාළ හේතු කාරණා කීපයක් බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියාය. ඒ අරඹයා උන්වහන්සේ ලබාදුන් උපදෙස් ඇතුළත් 'මල්ලිකෝවාද' නම් සූත්‍රයක් දේශනා කළ සේක. මෙම සූත්‍රයේ අඩංගු වන්නේ කාන්තාවක් ලස්සන වීමට හා අවලස්සන වීමට හේතුන්ය. එමෙන්ම කාන්තාවක් ධනවත් වීමට හා දිළිඳු වීමට හේතු වූ කරුණුය. තම රූ සපුව පිළිබඳ සැලකිල්ලක් දක්වන අපේ මව්වරු, දියණිවරු, සහෝදරියන් ඇතුළු සියලු දෙනා විශේෂයෙන්ම මේ සූත්‍ර දේශනාව

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''

කියවන්නේ නම් ප්‍රයෝජනවත්ය. එම සූත්‍රයේ සඳහන් වැදගත් කරුණු කිහිපයක් ඔබගේ දැනුවත්වීමට මෙසේ ඉදිරිපත් කරන්නෙමු.

● **දිනක් මල්ලිකා දේවිය බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මෙසේ විමසා සිටියාය. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ සමහර ස්ත්‍රීන් සිටිනවා, කිසිම ලස්සනක් නැති, දුර්වර්ණ, රූප ශෝභාවයක් නැති විරූපී අය. ඒ වගේම දුප්පත්, අමාරුවෙන් ජීවත් වන, සමාජයේ කිසිම පිළිගැනීමක් නැති, ඒ අයට එහෙම වෙන්න හේතුව කුමක්ද ස්වාමීනි?**

එයට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ, "මල්ලිකාවෙනි, මෙලොව ඇතැම් ස්ත්‍රීන් අතර නිතර සුළුදේටත් ගැටෙමින්, තරහින් හා අමනාපයෙන්, ක්‍රෝධ කරමින් තමන්ගේ ප්‍රකෘති ස්වභාවය නැති කර ගනිමින් වෛරයෙන් පසුවන කාන්තාවන් සිටී. එමෙන්ම අනුන්ට ලාභ සත්කාර, සමාජ පිළිගැනීම් ආදිය ලැබෙන විට ඊර්ෂ්‍යාවෙන් පසුවන කාන්තාවන් සිටී. එමෙන්ම අනුන්ට ලාභ සත්කාර, සමාජ පිළිගැනීම් ආදිය ලැබෙන විට ඊර්ෂ්‍යාවෙන් පසුවන ස්ත්‍රීන්ද, ශ්‍රමණ, බ්‍රාහ්මණ ආදී කිසිවකුටත් ආහාර පාන, වස්ත්‍ර, මල් සුවඳ, ප්‍රදීප උපකරණ ආදිය කිසිවක් හැකි පමණින් දන්දීමක් සිදු නොකරන කාන්තාවන් ද සිටී. එවැනි අය මේ ආත්ම භාවයෙන් මිදී යම් තැනක උපත ලබයිද, ඒ ආත්ම භාවයෙහි එම ස්ත්‍රිය දුර්වර්ණ, විරූපී, දැකීමට අප්‍රිය වේ. අල්පභෝගී ඇති තැනැත්තියක් වේ, දිළිඳු වේ, අල්පේශාක්‍ය වේ" යනුවෙන් තථාගතයෝ පිළිතුරු දුන් සේක.

● **ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ සමහර ස්ත්‍රීන් සිටිනවා, කිසිම ලස්සනක් නැති, දුර්වර්ණ, රූප ශෝභාවයක් නැති අය. නමුත් ධන බලය හා සමාජයේ පිළිගැනීමක් තිබෙන. මෙහෙම වෙන්න හේතුව කුමක්ද ස්වාමීනි?**

එයට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ, "මල්ලිකාවෙනි, මෙලොව ඇතැම් ස්ත්‍රීන් අතර නිතර සුළු දේටත් ගැටෙමින්, තරහින් හා අමනාපයෙන්, ක්‍රෝධ කරමින්, තමන්ගේ ප්‍රකෘති ස්වභාවය නැතිකර ගනිමින් වෛරයෙන් පසුවන කාන්තාවන් සිටී. නමුත් ශ්‍රමණ බ්‍රාහ්මණ ආදීන්ට ආහාරපාන, හැකි පමණින් දන්දීම් සිදුකරයි. එබඳු ස්ත්‍රීන් මේ ආත්ම භාවයෙන් මිදී යම් තැනක උපත ලබයිද, ඒ ආත්ම භාවයෙහි එම ස්ත්‍රිය රූපයෙන් දුර්වර්ණ වීම් (ආදී ඉහත ලක්ෂණ) ඇතිව උපදී. නමුත් මහත් වූ ධනය හා භෝග සම්පත්වලින් ආඪ්‍ය ඇති තැනැත්තියක් වේ. මහේශාඛ්‍යද වේ."



● **ස්වාමීනි භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, මේ ලොව සමහර ස්ත්‍රීන් සිටිනවා හරිම ලස්සන රූප ශෝභාවයෙන් හා වර්ණයෙන් යුක්තයි. දකින විට සිත පහදිනවා. නමුත් දුප්පත්, අමාරුවෙන් ජීවත් වන, කිසිම පිළිගැනීමක් නැති අය. ඒ අයට එහෙම වෙන්න හේතුව කුමක්ද ස්වාමීනි?**

"මල්ලිකාවෙනි, මෙලොව ඇතැම් ස්ත්‍රීන් අතරින් නිතර සුළු දෙයටත් නොගැටෙමින්, තරහින් අමනාපයෙන්, ක්‍රෝධ නොකරමින්, ද්වේශ නොකරමින්, එකට එක නොකරන අය සිටී. නමුත් අනුන්ගේ ලාභ සත්කාර දැක ඊර්ෂ්‍යා කරයි. හැකි පමණින්වත් දන්දීම් සිදු නොකරයි. එබඳු ස්ත්‍රීන් මේ ආත්ම භාවයෙන් චුතව යම් තැනක උපදීද, ඉතාමත් රූමත්, දර්ශනීය, දැක්මට ප්‍රිය උපදවන සුළු වෙයි. එනමුත් පෙර දනමාන ආදිය නොදුන් නිසාද, අනුන්ගේ ලාභ සත්කාර දැක ඊර්ෂ්‍යා කළ නිසාද, අල්පභෝගී ඇති දිළිඳු භාවයට පත්වේ. තේජස් නොමැති වූ අල්පේශාඛ්‍ය වේ" යනුවෙන් තථාගතයෝ පිළිතුරු දුන් සේක.

● **අවසාන වශයෙන් මල්ලිකා දේවිය බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසා සිටියාය. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයේ සමහර ස්ත්‍රීන් සිටිනවා හරිම ලස්සන රූපශෝභාවයෙන් හා වර්ණයෙන් යුක්ත, දකින විට සිත පහදින, ප්‍රිය උපදවන සුළු ඒ වාගේම මහත් වූ ධනය හා භෝග සම්පත් ඇති ධන බලය හා සමාජයේ පිළිගැනීමක් තිබෙන. මෙහෙම වෙන්න හේතුව කුමක්ද ස්වාමීනි?**

එයට පිළිතුරු දෙන මහා කාරුණික වූ භාග්‍යවත් බුදු පියාණන් වහන්සේ, "මල්ලිකාවෙනි, මෙලොව ඇතැම් ස්ත්‍රීන් අතරින් නිතර සුළු දෙයටත් නොගැටෙමින්, අමනාපයෙන්, ක්‍රෝධ නොකරමින්, ද්වේශ නොකරමින්, තමන්ගේ ප්‍රකෘති ස්වභාවය නැති නොකර ගනිමින්, වෛරයෙන් පසු නොවෙමින්, එකට එක නොකරන අය සිටී. අනුන්ගේ ලාභ සත්කාර දැක ඊර්ෂ්‍යා නොකරයි. හැකි පමණින් ශ්‍රමණ බ්‍රාහ්මණ ආදීන්ට දන්දීම් සිදුකරයි. එබඳු ස්ත්‍රීන් මේ ආත්ම භාවයෙන් චුතව යම් තැනක උපදීද, ඉතාමත් රූමත්, දර්ශනීය දැක්මට ප්‍රිය උපදවන සුළු වෙයි. පෙර දනමාන ආදිය දුන් නිසාද, අනුන්ගේ ලාභ සත්කාර දැක ඊර්ෂ්‍යා නොකළ නිසාද, මහත් වූ ධනය හා භවභෝග සම්පත්වලින් පරිපූර්ණ වූ සමාජයේ පිළිගැනීමට ලක් වූ, මහා තේජස් ඇති මහේශාඛ්‍ය තැනැත්තියක් වේ" යනුවෙන් තථාගතයෝ පිළිතුරු දුන් සේක.

ඔබ හොඳින් විමසා බලන්න. එදා මල්ලිකා දේවිය දුටු එම ස්ත්‍රීන් හතර වර්ගයම අද අප ජීවත් වන මේ වර්තමාන සමාජය තුළද බහුලව දක්නට ලැබේ. ඔබද අනිවාර්යයෙන්ම මේ කුමන හෝ එකකට අයිති වේ. එබැවින් තම තමාගේ රූ සපුවද, ධනපති භාවය පිළිබඳවද තමන්ට තමා පිළිබඳවම තක්සේරු කරගත හැකිය. මෙලොව ජීවිතය පමණක් නොව මරණින් මතු ජීවිතයද ඉතාමත් රූමත්, දර්ශනීය, අනුන්ට දැක්මට ප්‍රිය උපදවන සුළු මහත් වූ ධනය හා භවභෝග සම්පත්වලින් පරිපූර්ණ වූ සමාජයේ පිළිගැනීමට ලක්වූ අයකු වීමට ඔබ කැමති නම්, ඔබත් අද සිටම බුදුරජාණන් වහන්සේ ඔබ වෙනුවෙන්ම වදාළ මෙම සුවිශේෂී කරුණු ඔබ තුළ ක්‍රියාත්මක කිරීමට වහ වහා උනන්දු වෙන්න. එය කෙදිනක හෝ ඔබේම සැනසීම පිණිසම පවතින බව නිසැකය.

*(මූලාශ්‍රය - මල්ලිකා සූත්‍රය, අංගුත්තර නිකාය)*

**කේ. ඩී. නුවන් චාමර විජයවර්ධන**

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."



# සත්පුරුෂයා

## හඳුනා ගන්නා හැටි

අසත්පුරුෂයාගේ ගති සිරිත් කෙබඳුද? **(කතමො ච භික්ඛවේ අසප්පුරිසො)** ඔහු ප්‍රාණඝාත කරයි. අන්සතු දෑ පැහැර ගනී. කාමයේ වරදවා හැසිරෙයි. බොරු කියයි. රහමෙර පානය කරයි. මෙබඳු ස්වභාව සහිත පුද්ගලයා අසත්පුරුෂයෝ යැයි කියනු ලැබේ.

අසත්පුරුෂයා කෙබඳුද? ඔහු මෙසේයි. තමාත් ප්‍රාණඝාත කරයි. අනුනුත් එහි සමාදන් කරවයි. **(සමාදපේති)** අන්සතු දේත් පැහැර ගනී. අනුන්ටත් එය හුරු කරවයි. කාමයේ වරදවා හැසිරෙයි. අනුනුත් එහි සමාදන් කරවයි. බොරුත් කියයි. අන්‍යයාටද එසේ කරන ලෙස අවවාද අනුශාසනා කරයි. රහමෙරත් බොයි. අන්‍යයාද එහි සමාදන් කරවයි.

සත්පුරුෂයාගේ ගති සිරිත් කෙබඳුද? **(කතමො ච භික්ඛවේ සප්පුරිසො)** ඔහු ප්‍රාණඝාත නොකරයි. අන්සතු දේ පැහැර නොගනී. කාමයේ වැරදි ලෙස නොහැසිරෙයි. බොරු නොකියයි. රහමෙරත් නොබොයි. මේ ස්වභාව සහිත පුද්ගලයා සත්පුරුෂයා යැයි කියනු ලැබේ.

''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''



සත්පුරුෂතරයා කෙබඳුද? ඔහු මෙසේයි. තෙමේත් ප්‍රාණඝාත නොකරයි. අනුන්ටත් එහි වටිනාකම පැහැදිලි කර දෙයි. තමනුත් අන්සතු දේ පැහැර නොගනී. අනුන්ටත් එහි වැදගත්කම පැහැදිලි කර දෙයි. තමනුත් කාමයේ වැරදි ලෙස හැසිරීමෙන් දුරුවෙයි. අනුන්ටත් එය හුරු කරවයි. තමනුත් බොරු නොකියයි. අනුන්ටත් ඒ කෙරෙහි නැඹුරුවක් ඇති කරවයි. තමනුත් රහමෙරින් දුරුවෙයි. අන්‍යයනුත් ඉන් ඉවත් කරවීමට උනන්දුවක් දක්වයි.

සමාජයේ ජීවත් වන පුද්ගලයන් දෙදෙනකු පිළිබඳව කරනු ලබන අවධාරණයක් සත්පුරිස සූත්‍රයට පාදක වී තිබේ. සමාජය යනු කේවල පුද්ගලයකු නොවේ. නමුත් සමාජය යැයි කී විට තමනුත් ඇතුළත් වෙයි. මේ සමාජය නරකයි යනුවෙන් කෙනෙක් කියන විට එය ප්‍රකාශ කරනු ලබන්නා එයට හසුවන්නේ නැත්ද? ඔහුත් අනිවාර්යයෙන්ම එයට අයත්ය. කියන්නා ඇතැම් විට එය නොසිතයි.

මෙහි සාකච්ඡා වන සත්පුරුෂ සහ අසත්පුරුෂ යන ලක්ෂණ දෙකෙන් එක ගොඩකට ඔබද අනිවාර්යයෙන්ම අයත් වෙයි. ඇතැම් විට එම ලක්ෂණ දෙකම මඳ මඳ වශයෙන් ඔබ තුළ පවතිනවා විය හැකිය. මෙහි හොඳ පක්ෂය නියෝජනය වන්නේ සත්පුරුෂයාගෙන්ය. එයද කොටස් දෙකකට බෙදයි. හොඳ සහ වඩාත් හොඳ වශයෙනි. ඔබ ජීවත් වන සමාජයේ එබඳු හොඳ සහ වඩාත් හොඳ පුද්ගලයන් ඇතැම් විට හමුවී තිබෙන්නට පුළුවන. මෙහි හොඳ යනුවෙන් අදහස් කරනු ලැබුවේ සූත්‍රයේ සත්පුරුෂ ලක්ෂණ පවතිනවා යැයි කියූ පුද්ගලයාටයි. එම ලක්ෂණ පවතී නම් පමණක් ඔහු හොඳ කෙනෙකි. සත්පුරුෂයෙකි. නමුත් සමාජයේ ජීවත් වන අය 'හොඳ', 'සත්පුරුෂ' ආදී වචන භාවිත කරන්නේ එබඳු අයටද? නැත. තමා සමග හොඳින් සිනාවෙන, එහෙම නැත්නම් හොඳින් කතා කරන, තමා කියන දෙයම අනුමත කරන, තමන්ගේ ගුණ යහපත්කම, ශරීර ලක්ෂණ ආදිය තමාට ඇසෙන්නට කියන, තමන්ට යම් යම් උදව් පදව් කරනවා යැයි හැඟෙන අය හොඳ අය ලෙස හැඳින්වීම සමාජයේ පවතින සාමාන්‍ය සිරිතයි.

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

එය සාවද්‍යය. බුදු දහම කියා දෙන්නේ ඔවුන් එසේ තමන්ගේ යහපත පිණිස කටයුතු කරනු ලබන නිසා ඔහුත් හොඳ අය ලෙස හඳුනා ගැනීමට ප්‍රථම තවත් පරීක්ෂණයක් කළ යුතු බවයි. එනම් ඔවුන් එසේ කරන්නේ කුමක් සඳහාද? කෙබඳු අරමුණක් සහිතවද යන්න සොයා බැලිය යුතු බවයි.

එහි ප්‍රතිඵලය එකවර කිව හැකි නොවෙයි. ඒ සඳහා ඔවුන් දීර්ඝ කාලයක් ඇසුරු කළ යුතු වෙයි. දීර්ඝ කාලයක ඇසුරකින් තොරව පුද්ගලයකුගේ හොඳ නොහොඳ පිළිබඳව වාර්තාවක් දිය නොහැකි බව බෞද්ධ මතයයි. යම් පුද්ගලයකු හොඳ කෙනකු හෝ සත්පුරුෂයකු වශයෙන් කිව හැකි වන්නේ සමාජයේ හා තමාගේ යහපත පිණිස කටයුතු කිරීම හේතුවෙනි. අයහපතෙහි යෙදෙන අන්‍යයන්ද නිවැරදි මාවතට ගැනීම පිණිස කරනු ලබන සත්භාව අවංක උත්සාහ විසින් ඔහු සත්පුරුෂයකු බවට පත්කරවයි. අන්‍යයන්ගේ වැරදි අඩුපාඩු නරක චේතනාවෙන්ම සොයමින් ඔවුන්ට දඬුවම් පැමිණවීම පිණිස කටයුතු කරන්නා කෙබඳු සත්පුරුෂ ගණයේ සලකා ගිනිය නොහැකි බව දහමින් අවධාරණය වෙයි.

හැම දෙයකටම උදව් නොකරන, තමන් ඉදිරියේ තමන්ගේ ගුණ වනන්නේ නැති, තමන් කරන නරක අනුමත නොකරන අය අසත්පුරුෂයන් ලෙස හැඳින්වීම සාමාන්‍ය සිරිත වුවද එය සාවද්‍ය බව වටහා ගත යුතුය. තමාට ලැබිය යුතු හා එසේ නොලැබීම නිසාම ඔහු අසත්පුරුෂයකු යැයි කීම හරිද? ධර්මයේ නරක සහ වඩාත් නරක යනුවෙන් දක්වා ඇති වචන කෙරෙහි නැඹුරු බවක් ඇතිකර ගැනීම වඩාත් වැදගත් වෙයි. අසත්පුරිස සහ අසපුරිසතර යනු එම වචන දෙකයි. ඔබ එබඳු කෙනෙක්ද? ඔබ වටා එබඳු අය කොපමණ සිටිනවාද යන්න විමසා බැලිය යුතු නොවේද? එසේ කොට කළ යුත්තේ ඔවුන්ගෙන් දුරින් දුරු වීමද, පුද්ගලයා දැන හඳුනාගෙන ජීවත් වීමද යන්න වටහාගත යුත්තේ තමන්ම නොවේද?

දුසිරිතට නැඹුරුවීම අසත්පුරුෂයාගේ ලක්ෂණය වුවද අසත්පුරුෂතරයා එයට වඩා වෙනස් බව හඳුනා ගත යුතු වෙයි. ඔහු තමා කරන අවර ක්‍රියාව එසේ කරමින් අන්‍යයාද ඒ කෙරෙහි ආශක්ත කරවයි. එය වඩාත් නපුරුය. එබඳු ක්‍රියාවක ප්‍රතිඵලය කෙබඳු ඉසව්වකදැයි හඳුනා ගැනීමද අසීරුය. වර්තමාන සමාජයේ මීට වඩා සියුම්, එනම් සූත්‍රයේ කරන වර්ගීකරණයට එකවර අසු නොවන අසත්පුරුෂයන්ද දක්නට ලැබෙයි. එබඳු අත්දැකීම් ඇතැම් විට ඔබටද හමුවී තිබෙන්නට පුළුවන. මන්ද ඔබද සමාජය සත්වයකු නිසාය. තමා දුසිරිත නොකර අන්‍යයා ඒ කෙරෙහි නැඹුරු කරවන අයද සිටිති. සූත්‍රයේ නැතත් ඔවුන් හඳුනා ගැනීමට එමගින් ආලෝකයක් සපයයි.



සමාජ හිත පිණිස නොපවතින වෙළෙඳ දැන්වීම්ද ධර්මය ලෙස අඟවා අධර්මය කියා දීමද මේ ගණයට වැටෙයි. ඊර්ෂ්‍යාව, වෛරය හෝ ද්වේෂය නිසා පෙරට යන කෙනකු විෂමාචාරයකට නැඹුරු කරවීම හෝ එසේ කිරීමට උත්සාහ දැරීම එබඳු වර්ගයාට වැටෙන අකුසලයකි. අසත්පුරුෂ ධර්මයකි. අසත්පුරුෂ ධර්මය ඉතාමත් සියුම්ය. ඇතැම් විට එය තමා ළඟ තිබේද යන්න තමාද නොදන්නවා විය හැකිය. එසේද සැඟවී රැඳෙන්නට හැකි අසත්පුරිෂ ධර්ම හා එබඳු ක්‍රියා පිළිබඳව නිතර අවධානයෙන් සිටිය යුතුය. මන්ද තමාටද රහසින් තම සිත තුළ හෝ ක්‍රියාව තුළ තිබිය හැකි බැවිනි.

**මහාචාර්ය පූජ්‍ය පාතේගම ඥානිස්සර හිමි**

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# මරණය මොහොතේ දුක් නොවන්නට

## බුදුන් වදාළ උපදෙස්

බෞද්ධයන් ලෙස අපි සැම දෙනාම පුනර්භවය විශ්වාස කරමු. මියයන හැම කෙනෙක්ම නැවත භවයට ඉපදෙන බවට විශ්වාස කිරීම පුනර්භවයක් ලැබීම ලෙස සැලකේ.

යම් පුද්ගලයකු ජීවත්ව සිටින කාලයේ කළ හොඳ සහ නරක කර්ම අනුව ඒ පුද්ගලයාගේ සුගතිය හෝ දුගතිය තීරණය වේ. මේ අනුව හොඳ කර්ම නිසා සුගතියත්, නරක කර්ම නිසා දුගතියත් අත්වනු ඇත.

මිනිසුන් කර්ම රැස්කරන ආකාර තුනකි. ඒ සිතින් කයින් හා වචනයෙනි. බොහෝ දෙනෙක් සිතා සිටින්නේ කයින් සහ වචනයෙන් කරන ක්‍රියාකාරකම් වැඩි බවයි. නමුත් කයින් සහ වචනයෙන් කරන සෑම ක්‍රියාකාරකමකටම මනසද සම්බන්ධ වේ. ඒ අනුව වැඩිම කර්ම ප්‍රමාණයක් කරන්නේ සිතෙනි.

මනසින් කර්ම රැස්කිරීම මනෝ කර්ම ලෙස දැක්වෙයි. කායික, වාචසික හා මානසිකව සිදුවන සෑම ක්‍රියාවක් සමගම බැඳෙන ප්‍රධානතම දෙය වන්නේ සිතය. සිතින් සිතන්නේ නැතිව කයින් ක්‍රියාවක් හෝ මුවින් වචනයක් හෝ සිතින් සිතිවිල්ලක් හෝ ක්‍රියාත්මක කළ නොහැකිය.

සමහරු නරක ක්‍රියාවක් කර ''මං ඒක එච්චර හිතුවෙ නෑ'' යනුවෙන් පවසති. සිතුවේ නැත්තේ කර්මය හෙවත් තමන් කරන ලද දෙය ගැන නොවේ. එයින් ලැබෙන විපාගකය ගැනය. සිතින් සිතන්නේ නැතිව අතක් පයක්වත් සොලවන්නට බැරිය. එහි සරල අදහස වන්නේ සෑම ක්‍රියාවක් සමගම සිත බැඳී ඇති බවය.

සිත, කය, වචනය මුල් කරගෙන කිසියම් ක්‍රියාකාරකමක් සිදුකරන විට එම ඇතැම් ක්‍රියාකාරකම් තදින් අපගේ මනසේ රැ දෙයි. එලෙස තදින් මනසේ රැදෙන්නේ ප්‍රධාන හේතු දෙකක් නිසාය.

1. සිදුකරන ක්‍රියාවේ ප්‍රබල බව අනුව
2. ඒ ක්‍රියාව නැවත නැවත සිදුකිරීම මත

නැවත නැවත සිදුකරන ක්‍රියාකාරකම් ධර්මයෙහි දක්වන්නේ ආචින්න කම්ම ලෙසිනි. පුරුද්දක් ලෙස සිදුකරන කර්ම ලෙසද මෙය පැහැදිලි කිරීමට පුළුවන. මේ කර්ම හොඳ හෝ නරක ඒවා විය හැකිය. මේ දෙආකාරයටම සිතේ තදින් රැදෙන සිතිවිලි කෙනකු මියයන මොහොතේ ඒ තැනැත්තාගේ චුති සිතටත් බලපානු ඇත. චුති සිත යනු මියයන මොහොතේ අන්තිමට පහළ වන සිතිවිල්ලය. කෙනකුගේ ඊළඟ ප්‍රතිසන්ධිය සඳහා බලපාන්නේ එම සිතිවිල්ලයි. චුති සිතට අරමුණු වන්නේ බොහෝවිට දිගින් දිගටම පුරුදු කළ ආචින්න කර්මයන්ය. ඒ කර්මයට අනුරූපව ඊළඟ ප්‍රතිසන්ධිය ලබනු ඇත.

උඩු සිත හා යටි සිත යනුවෙන් සිත කොටස් දෙකකි. උඩු සිත ක්‍රියාත්මක වන්නේ, ඉන්ද්‍රියයන් හා බද්ධ වීමෙනි. එනිසා එය ඉන්ද්‍රිය බද්ධ විඥනය යනුවෙන් හැඳින්වෙයි. මෙම ඉන්ද්‍රිය බද්ධ විඥනය හරහා ගන්නා අරමුණු (එනම් ඇස්, කන් ආදී පංච ඉන්ද්‍රියයන්ගෙන් ගන්නා අරමුණු) උප විඥනයේ හෙවත් යටි සිතේ තැන්පත් වෙයි. රසායන ප්‍රතික්‍රියාවක් හෝ කායික දුබලතාවක් මත ඉන්ද්‍රිය බද්ධ විඥනයේ අරමුණු දැනගැනීමේ ශක්තිය දුර්වල විය හැකිය. එවිට සිදුවන්නේ එය ක්‍රියාත්මකව පැවැති කාලයේ උපවිඥනයේ තැන්පත් වූ අරමුණු සමග යටි සිත ක්‍රියාත්මක වීමය. ඒ අනුව සිහි නැතිව සිටින කෙනෙක් මියයන විට යටි සිතේ තැන්පත්ව තිබෙන සිතිවිලි අනුව චුති සිත සැකසෙනු ඇත. මෙසේ යටි සිතේ තැන්පත් වී තිබුණේ, තදින් සිතට දැනුණු නරක කර්මයක් නම් ප්‍රතිසන්ධියේදී ඒ කරන ලද කර්ම ඉස්මතු වෙයි. ඒ ක්‍රියාව හා ක්‍රියාව කිරීමට බලපෑ අරමුණු චිත්ත රූප ලෙස ඉස්මතු වී මැවී පෙනෙනු ඇත. හරියටම කිව්වොත් රූපවාහිනී තිරයෙන් රූප පෙනෙන අයුරිනි. ඒවා නරක කර්ම නම් සිත කිළිටි සහ අප්‍රසන්න වන අතර හොඳ කර්ම නම් පුරුද්දක් ලෙස සිදුකරන අයකු හදිසි අනතුරක් වැනි දේකින් මියගියත් ඒ තැනැත්තා කළ හොඳ කර්ම ඒ මොහොතේදී මනසෙහි ඉස්මතු වනු ඇත.

මේ සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ ඉතා වැදගත් උපමාවක් දක්වා ඇත. ගිතෙල් පිරුණු කලයක් වතුර පිරි ජලාශයක වතුර යට තබා බින්දෙත් ගිතෙල් වතුර උඩට මතුව එනු ඇත. ඒ අයුරින් යහපත් ක්‍රියාවන් පුරුදු කළ අයකු හදිසියේ මියගියත් ඒ මොහොතේ හොඳ අරමුණු උඩට මතුවෙයි. ප්‍රතිසන්ධිය යහපත් තැනක සිදුවීම සඳහා එය බලපානු ඇත.

චුති සිත යනු ඉතාමත් ප්‍රබල දෙයකි. පහනක් නිවෙන්නට ආසන්න වන විට දැල්ල වඩාත් ලොකු වන බව සහ ප්‍රබල වන බව ඔබ දනියි. මරණයට පත්වීමට ආසන්න මොහොතේ පැවැති චුති සිතද එවැනිය. ඒ මොහොතේ මනසට තදින් වැදුණු අරමුණක් චුති සිත තුළ ප්‍රබල වනු ඇත.

චුති සිත ශක්තිමත් නිසා මරණාසන්න මොහොතේ යහපත් අරමුණක් සිතට ආවොත් ඒ අරමුණ ප්‍රබල වී ඒ හොඳ අරමුණට අනුරූපව ඊළඟ භවය ප්‍රබල වෙයි. එය නරක කර්මයක් නම් ඊළඟ භවය දුගතියක සිදුවනු ඇත. ඒ අනුව චුති සිත ප්‍රබල වීම තුළින් ප්‍රතිසන්ධිය ප්‍රබල කිරීම සඳහා කර්මයක් සකස් කිරීම සිදුවෙයි.

ජීවත් වන හැමදෙනාම කෙදිනක හෝ මිය යති. මැරෙන අය රහත් ඵලයට පිවිස සිටියේ නැත්නම් අනිවාර්යයෙන්ම නැවත උපදිනු ඇත.

''කිසිම දුකක් වින්දෙ නෑ නින්දෙන්ම අන්තිම හුස්ම ටික පිටවෙලා තිබුණා. හරිම සාමකාමී මරණයක්'' යනුවෙන් සමහරුන්ගේ මරණය සිදුවූ ආකාරය ගැන ඔවුන්ගේ පවුල්වල අය කියති. එය හරිම පීස්ෆුල් මරණයක් ලෙස ඔවුන් කියන්නේ මියගිය තැනැත්තා වටේ සිටින අයට එලෙස පෙනුණු නිසාය. නමුත් ඒ තැනැත්තා, තැනැත්තිය මියයන මොහොතේ සිහිසුන්ව හෝ නින්දෙන් සිටියා වුණත් ඒ පුද්ගලයාගේ යටි සිත ක්‍රියාත්මකය.

''දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.''



ඒ අනුව ඒ මොහොතේ ඒ තැනැත්තාගේ චුති සිතේ කුමන අන්දමේ සිතිවිල්ලක් තිබුණාදැයි අප දන්නේ කොහොමද? ප්‍රකෘති සිහියෙන් සිටින කෙනකුට නම් මරණාසන්න මොහොතේ ඒ පුද්ගලයාගේ ආගමට අනුව පිරිතක්, වෙනත් සෙත් ශාන්තියක් වැනි දෙයක් කළ හැකි වෙයි. එවිට චුති සිත වශයෙන් ඒ මොහොතේ පවතින්නේ යහපත් සිතිවිලිය. එම චුති සිතට අනුව ඊළඟ භවය සැකසෙනු ඇත. නමුත් සිහිසුන්ව සිටින කෙනකු වෙනුවෙන් එවැනි උපකාරයක්වත් ජීවත්ව සිටින අයට සිදුකළ නොහැකිය.

අප හැම දෙනාටම මරණය නම් වූ එම දුක්ඛදායක අත්දැකීමට මුහුණ දෙන්නට කවද හෝ සිදුවෙයි. එය කායික මානසික පීඩාවක් ඇති කරවන දෙයකි. නමුත් මරණයට අපට සාර්ථකව මුහුණ දෙන්නට බැරිකමක් නැත. ඒ ජීවත්ව සිටින කාලය තුළ යහපත් දේවල් කිරීමෙනි.


සිය ජීවිත කාලය පුරාම ගව ඝාතකාගාරයක ගවයන්ට වධ දී මරා දැමීම ජීවිකාව ලෙස කළ එක්තරා තැනැත්තකු ජීවිතේ අවසන් දිනවල බෙල්ල වටා කුණු වී ශ්‍රාවය ගලමින් අප්‍රමාණ දුක් විඳි අතර ගවයකු මරා දමන මොහොතේ කෑගසන අයුරින් එක දිගට දවස් කීපයක්ම තිස්සේ කෑගසමින් අවසන් හුස්ම හෙලූ බවටද පසුගිය කාලයේ මට වාර්තා විය. මෙවැනි සිද්ධි මේ සමාජය තුළ ඉතා බහුල වශයෙන්ම අපට අසන්නට දකින්නට ලැබෙයි.

බවක් නැතිව, දුකක් නැතිව, චිත්ත පීඩාවක් නැතිව මරණයට මුහුණ දෙන්නට හැකි වන්නේ යහපත් ලෙස ජීවත් වූ අයකුට පමණි. අනෙක් හැම දෙනාටම තමන් කරන ලද අයහපත් ක්‍රියාවන් නිසා මරණාසන්න මොහොතේ බය, දුක, වේදනාව ඒකාන්තයෙන්ම දැනෙනු ඇත. බියෙන්, දුකින්, වේදනාවෙන් මියයන කෙනකුගේ ඊළඟ භවය දුගතිගාමී වේ. මිනිසුන් ඉපදී, ජීවත් වී මියගොස් නැවත මිනිසුන් වී ඉපදීම ඉතා අපහසු කටයුත්තක් බව බුදු දහමේ දැක්වේ. මෙහිදී බොහෝ දෙනකු නගන ප්‍රශ්නය වන්නේ, එහෙම නම් එන්න එන්නම ජනගහණය වැඩි වන්නේ කොහොමද? යන්නය. ඔබේ ප්‍රශ්නය තාර්කිකය. නමුත් එය වැරදිය. අපට විශාල මිනිස් ජනගහණයක් සිටින බව දැනෙන්නේ එය දැසට පෙනෙන නිසාය. නමුත් මේ මිහිතලය මත සිටින කුඹියාගේ සිට අලියා දක්වා වූ ඇසට පෙනෙන තිරිසන් සතුන් හා නොපෙනෙන කුඩා ජීවීන්ට සාපේක්ෂව මනුෂ්‍යයන් කොපමණ සිටිනු ඇතිදැයි ඔබට සිතා ගත හැකිද? එක මනුෂ්‍යයකුගේ ශරීරය ඇතුළත පමණක් පණුවන් කොපමණ ප්‍රමාණයක් සිටිනවා විය හැකිද? ඒ නිසා අර විදියේ ප්‍රශ්න නැගීම ඒ තරම් නුවණැති ක්‍රියාවක් නොවේ.

කෙසේ වුවද වෙන මොන දේ අපෙන් ගිලිහී ගියත් මරණය අපෙන් ගිලිහී යන්නේ නැත. නිසැක ලෙසම, අනිවාර්යයෙන්ම කවද කොයි මොහොතේ හෝ එය අපට හිමිවෙයි. ඒ අනුව මරණය සොඳුරු අත්දැකීමක් කරගන්නට නම් ඔබේ පැවැත්ම හැමවිටම නිවැරදි මාර්ගයට යොමු කර ගන්න. යහපත් දේ කරන්න. සියලු වැරදිවලින් මිදෙන්න. මිනිස්, තිරිසන් ආදී සියලු සත්වයන් කෙරෙහි කරුණාව, දයාව දක්වන්න. ඔබට යහපතක්ම වනු ඇත. ඊළඟ භවයත් සුගතිගාමී වනු ඇත.

**ධර්ම ගවේෂක**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''



ධර්ම දේශනය

# දැහැමි දිවිපැවැත්ම අපහසු වුවත් එය ශ්‍රේෂ්ඨ දිවිපැවැත්මකි



දේශකයාණෝ : ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශද්වර්ගික කාරක සංඝ සභික

**පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර**

තේවාවහාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පින්වත්නි,

සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි චූල්ලසාරික නම් හික්ෂූන් වහන්සේ නමක් වාසය කළහ. ඒ හික්ෂූන් වහන්සේ අගසව් සැරියුත් මහතෙරුන් වහන්සේගේ අතවැසි හික්ෂු නමකි. චූල්ලසාරික හික්ෂූන් වහන්සේ බෝහෝ දෙනා හඳුනති. රෝගීන්ට පිළියම් කොට ලාභ සත්කාර ලබයි. යැපීම ද සුවසේ ලබන හික්ෂූන් වහන්සේ නමකි. දිනක් වෙදකමට ගිය උන්වහන්සේ රෝගියෙකු බලා බෙහෙත් නියම කොට එන විට, ඉතා මිහිරි ආහාරයක් ලැබ වෙහෙරට වඩින අතරමගදී, සැරියුත් මහතෙරුන් වහන්සේ වඩිනු දැක පසෙක සිට "හිමියනි, මම දැන් ලෙඩෙක් බලා බෙහෙත් නියම කොට එන්නෙමි. එතැනින් ඉතා මිහිරි ආහාරයක් ලද්දෙමි. එය පිළිගත මැනවි. මට මෙබඳු ආහාර දිනපතාම සුලභව ලැබේ. එනිසා නිතර මම මිහිරි ආහාර වළඳමියි" පැවසීය. එවිට සැරියුත් මහතෙරුන් වහන්සේ කිසිවක් කථා නොකොට දිගටම වැඩි සේක.

චූල්ලසාරික හික්ෂූන් වහන්සේ විහාරයට ගොස් තමාට ඉතා මිහිරි ආහාරයක් ලැබුනු බවත්, එය සැරියුත් මහතෙරුන් වහන්සේට පිළිගැන්වූ විට මුවින් නොබැන, නිහඬව වැඩි බවත් බුදුන් වහන්සේට සැලකර සිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ මහණෙනි, විළිබිය නැති තැනැත්තා කපුටෙකු වැනිය. කිළිටි දිවි පෙවෙත් ඇති තැනැත්තාට ජීවත් වීම සුවසේ කළ හැකිය. එහෙත් විළි බිය ඇති, නිතර යහපතෙහි යෙදෙන, පිරිසිදු දිවිපෙවෙතක් ඇති, ඒ පිරිසිදු දිවිපෙවෙතම සරුකොට ජීවත් වන්නා, ඉතා දුකසේ දිවි පැවැත්විය යුතු බව දක්වා පහත දැක්වෙන ගාථා දෙක වදාළ සේක.

''සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය.''

සුජීවං අහිරීකෙන - කාකසූරෙන ධංසිනා
පකඛන්‍දිනා පගබ්බෙන - සංකිලිට්ඨෙන ජීවිතං

ලැජ්ජා භය නැති ගසාකෑමෙහි සූර කපුටෙකු මෙන් අනුන්ගේ ගුණ මකන තමාට අයිති නැති වැඩට පනින්නා වූ උඩගු ස්වභාවය ඇති කිලිටි දිවිපැවතුම් ඇති තැනැත්තාට ජීවත් වීම ඉතා පහසු ය.

හිරීමතා ච දුජ්ජීවං - නිච්චං සුචිගවෙසිනා
අලීනෙන' පපගබ්බෙන - සුද්ධාජීවෙන පස්සතා.

පව් කිරීමට භය හා ලැජ්ජාව ඇති, නිතර පිරිසිදු ක්‍රියා කිරීමට සොයන, කුසල ක්‍රියාවෙහි නොපසුබස්නා, උඩගු බවක් නැති, පිරිසිදු ජීවිතයක් ඇති, දුරදිග බලන්නා වූ පුද්ගලයාට ජීවත්වීම දුෂ්කර ය.

ලැජ්ජා භය දෙකම නැති තැනැත්තා සූර වූ කපුටෙකු (කවුඩෙකු) වැනිය. මිනිසුන්ගේ ප්‍රමාදය දැක ඒ ඒ දේ ගසාකන හෙයින් කපුටා ගසා කෑමේ සූරයෙකි. එසේම කිසියම් පුද්ගලයෙකු යම් යම් අයගේ ඒ ඒ දේ නොමනා සේ ගසා කෑමද කවුඩු ගතියකි. අනුන්ගේ ගුණ සැඟවීමද අනුන් කළ යම් යම් හොඳ දේ තමන් කළ දේ ලෙස පෙන්වමින් ලාභ ප්‍රයෝජන ගැනීමද, අනුන්ගේ නුගුණ කීමෙන් ඔවුන්ගේ ගුණ මැකීමද ඉතා කිලිටි දිවිපෙවෙතක් ඇත්තවුන්ගේ ගතියෙකි. නොමගින් අනුන්ගේ දේ කඩාවඩා ගන්නා තැනැත්තන් අප සමාජයේ බහුලය. ඔවුන්ට සුවසේ ජීවත් විය හැකිය. එය සුවයක් යැයි එක එල්ලේ පෙනෙතත් සූරවූ කපුටෙකුගේ වැනි ඔවුන්ගේ දිවිපැවැත්ම නින්දිතය. ඉතා පිළිකුල් සහගතය. අනුන් රවටා කපුටෙකු සේ දිවි පවත්වාගෙන යෑම සුවසේ ජීවත් විමක් නොවේ. ලැජ්ජා භය නැති තැනැත්තාට, කායදුෂ්චරිතාදී පව් කම් කිරීමට පසුබට බවක් ඇති නොවේ. මව්පියන් නොවන අයට මව්පියන් මෙන් අමතා, ගුණ නැති අයට ගුණ ඇති අය සේ බොරු වර්ණනා කොට, රවටා කපටි බස් කීමෙන් ආහාර ආදී දේ සුවසේ සපයා ගෙන ජීවත් වීමේ හැකියාව ඔහුට ඇත. දක්ෂ කපුටෙකුගේ ස්වභාවය ද එයයි. කපුටා නිවෙස් වල බත් මාලු ආදිය කනු කැමැත්තෙන් නිසොල්මනේ බලා සිට ගෙයි මිනිසුන්ගේ ප්‍රමාදයක් දුටු විට ඒ ආහාර සොරා පළා යන්නා සේ ලැජ්ජා නැති අයද කිසිවක් නොකර අනුන්ගේ ගුණ මකා දමමින් තමන්ගේ නැති ගුණ හුවා දක්වමින් ආහාර ආදී වස්තුව ද, ගරු නම්බු ද, මුදල් හදල් ද, තාන්න මාන්න ද ලබාගෙන අනුන් රවටා ජීවත් වෙති. නමුත් එම ජීවත් වීම නින්දා සහගතය, ලැජ්ජා සහගතය. එය නැණවත් පුද්ගලයන්ගේ සිත සතුටු කිරීමට හේතු නොවේ. වැඩි කල් නොයා ඔවුන් ලබන ලාභයෙන් පිරිහේ. එබඳු අනුන්ගේ ගුණ මකමින්, අනුන් රවටමින්, කපටිකමින්, කිලිටි දිවිපැවතුම් ඇතිව, තාවකාලිකව සුවසේ විසුවත්, එය වැඩි කලක් පවත්වාගෙන යා නොහැකිය. ඔවුන්ගේ කපටිකම් හෙළිවූ දිනයක ලෝකයාගෙන් ලැබූ ලාභ ප්‍රයෝජන නොමැතිව පිරිහෙනු නියතය. ඔවුන්ගේ මෙලොව මෙන්ම පරලොව ජීවිතය ද පිරිහේ. අනුන් රවටා ජීවත් වීම පහසු නමුත් එය පව්කාර ජීවිතයකි. හැමදාම කළ නොහැක්කකි.

හිරි ඔතප් දෙක ඇති තැනැත්තා කාය දුෂ්චරිත ආදී පව්කම් වලට පසුබට වෙයි. බිය වෙයි. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන බිනීම, නිසරු බස් කීම, සුරා පානය, ආදී පව්කම් කිරීම කුලීනයන්ගේ වැඩක් නොවේ. අනුවණ පාපතරයන්ගේ ක්‍රියාවකි. පව්කම් කිරීම මා වැනි සූර මිනිසෙකුට නුසුදුසු යැයි කියා ද, නුවණැත්තන්ට අයත් නොවෙතැයි කියා ද, තමන්ගේ දැනඋගත්කම, තරාතිරම, පවුලේ ගෞරවය, ආත්ම ගෞරවය ගැන සිතා ලැජ්ජා භය උපදවා පවින් නිදහස් වෙයි. පවට ලැජ්ජා වෙයි. භය වෙයි. සිත, කය, වචන යන තිදොරින් පිරිසිදු වීමට යත්න දරයි. සැදැහැති කුල පුතුන් තම ආත්ම ගරුත්වය හා අධිපති බව ගැන සිතා අකුසලයෙන් මිදෙයි. කුසලයන් වඩයි. වරදින් මිදෙයි. පිරිසිදු ජීවිතයක් ගත කරයි. එබඳු තැනැත්තාට ජීවත්වීම ඉතා අපහසුය. මිහිරි, අම්හිරි, කටුක වශයෙන් බලාපොරොත්තු නොතබා, ලද දෙයින් සෑහීමට පත්ව ජීවත් වීම අපහසුය. දැහැමිව ජීවත් වීම අපහසු වුවත් හොඳ හැසිරීම, යහපත් දිවි පැවතුම වඩා නිවැරදි වුත්, ශෝබන වූත්, මොලොව, පරලොව යහපත සලසන්නා වූත් දිවි පැවැත්මකි. එබැවින් නරකින්, පවින්, අකුසලින් මිදී දුෂ්කර වුවත් කුසල් දම් මගෙහි හැසිරීමට යත්න දැරිය යුතුය.

මෙම දුක් සහිත සසරින් එතෙර වීමට නම් ධර්මානුකූලව ජීවත් වීම අවශ්‍යය. ධාර්මිකව ජීවත් වෙන විට ඒ තැනැත්තන් ධර්මය විසින් ම ඒකාන්තයෙන් ම ආරක්ෂා කරනු ලබයි. "ධම්මො හවේ රක්ඛති ධම්මචාරි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ එබැවිනි. ධර්මානුකූල ජීවිතයක් සාර්ථක කර ගැනීමට නම් සිත, කය, වචනය යන තුන්දොර මනාව හික්මවා ගත යුතුය. පුද්ගලයන් වැරදි හෝ නිවැරදි දේ කිරීමට පෙළඹෙන්නේ තුන්දොරේ ක්‍රියාකාරිත්වයෙනි. මේ ලෝකයේ ජීවත් වනවා යැයි කියන්නේ මේ තුන්දොර ක්‍රියාත්ම කිරීමටයි. සිත, කය, වචනය යන තුන්දොරින් රැස් කරන දෙයින් හොඳ දේ රැස් කරන්ටත්, හොඳ දේ කරන්ටත් උත්සුක විය යුතුය. එසේ ම පවින් බරවූවෙකුට නරක දේ රැස් කිරීමට ද මේ තුන් දොරින් පුලුවන. මේ තුන්දොරින් වැරදි දේ කළොත් ඒකාන්තයෙන් ම මෙලොව මෙන්ම පරලොව දුගති දුක් විඳීමට සිදුවනු නියතය. එබැවින් මෙම උතුම් පොහෝ දින පවට ලැජ්ජා භය ඇතිව කුසල් දහම් හි හැසිරෙමින් සිත, කය, වචන යන තුන්දොර හික්මවා ගනිමින් දැහැමි දිවිපෙවෙතක් ගත කිරීමට අදිටන් කර ගනිමු.

- තෙරුවන් සරණයි.



# ධම්මපදයෙන් දහම් ඔවදන්

## අංක 03

# තමනට අනුන් සිදු කළ නෙක දුසිරි වැඩ
# නිති සිහි කළොත් වෙර නැසුමට නොමැත ඉඩ

අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති - වෙරං තෙසං න සම්මති

(ධම්මපදය - යමක වර්ගය)

අසවලා මට බැන්නේ ය. මට ගැසුවේ ය, මා පැරැද්දුවේ ය. මාගේ දෙය පැහැර ගත්තේයැයි යමෙක් ඔහුට වෛර බඳිත් ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ

ඔබේ ප්‍රසන්න සිත කිලුටට පත් කරන සිතිවිල්ලක් පිළිබඳව මෙම ධම්මපද ගාථාවෙන් දක්වා ඇත. ඒ වෛරයයි. පුද්ගලයෙකුගේ චිත්ත සන්තානය තුළ වෛරය නොසන්සිඳීමට පාදක වන කරුණ මෙම ගාථාවෙන් පැහැදිලි වේ. තමාට අනුන් විසින් කරන ලද බැන වැදීම ආදී විවිධාකාර අකටයුතුකම් ගැන නැවත නැවත සිතීමත් ඒ ඔස්සේ වෛරය ඇති කර ගැනීමත් නිසා ඔවුනගේ වෛරය නොසන්සිඳේ. ඒ නිසාම තම සිත වඩවඩාත් දූෂිත වී ගොස් තමන් ද විනාශ වී අන් අයත් විනාශ කොට ලෝකය ම විනාශ වන තැනට කරුණු යෙදේ.

එසේ ලොවම විනාශ කරන වෛරය නම් කුමක් ද? සිතේ තද ගතිය යි. තරහෙන් කැකෑරෙමින් පලිගන්නා ස්වභාවය යි. තමාට සතුරුකමක් කළ අයගේ විනාශය දකින්නට ඇති කැමැත්ත යි. ඔවුන් විනාශ කරන්නට සැලසුම් සෑදීම වෛරයේ ස්වභාවය යි.

ඔබ දන්නවා ද? ඔබේ සිත අනුන් කෙරෙහි ආකාර 9 කින් වෛරය උපදවා ගන්නා බව. නව අඝාත වස්තු නමින් ධර්මයේ සඳහන් වන්නේ එය යි. එම ආකාර නමය නම්

1. අසවලා මට පෙර අවැඩක් කළේ ය.
2. අසවලා මට දැන් අවැඩක් කරයි.
3. අසවලා මට මතුවට අවැඩක් කරන්නේ ය.
4. අසවලා මගේ මිතුරාට පෙර අවැඩක් කළේ ය.
5. අසවලා මගේ මිතුරාට දැන් අවැඩක් කරයි.
6. අසවලා මගේ මිතුරාට මතුවට අවැඩක් කරන්නේ ය.
7. අසවලා මගේ සතුරාට පෙර යහපතක් කළේ ය.
8. අසවලා මගේ සතුරාට දැන් යහපතක් කරයි.
9. අසවලා මගේ සතුරාට මතුවට යහපතක් කරන්නේ ය.

මීට අමතරව කිසිදු පුදගලයෙකුගේ මැදිහත් වීමක් නැතිව ඔබේ ම නොසැලිකිලිමත් කම නිසා ස්වාභාවික හේතු ආදියෙන් ඔබේ සිතේ වෛරය උපදී. එසේ වෛරය ඇති වූ අත්දැකීම් ඔබට ඕනෑ තරම් ඇත. එය හඳුන්වන්නේ අස්ථාන වෛරය යනුවෙනි. ඉහත අවස්ථා නමයට මෙය ද එක් වූ විට දස අඝාත වස්තු බවට පත් වේ.

මේ තුමන ආකාරයකින් කුමන හේතුවකින් හෝ ඔබේ සිතේ වෛරය ඇති වූ විට කෙලෙසෙන්නේ ඔබේ සිතයි. ඔබේ ප්‍රසන්න සිත කෙලෙසුණු විට ඔබව අයහපතට, දුසිරිතට ඇද දමනු හැර ඔබට යහපතක් කිසිසේත් ඉටු කළ නොහැක. ඔබ මහා විනාශ කරුවෙක්, මහා අපරාධ කරුවෙක් බවට පත් කරන්නේ මේ වෛරය යි. එවිට ඔබ සමාජයෙන් පිරිහුණු පුද්ගලයෙක් වෙයි. ඊට ඔබ කැමති ද? අකමැතියි නේද? එසේ නම් ඔබ කළ යුත්තේ කෙනෙක් ඔබට යම් අකටයුත්තක් කළ විට ඔහු කෙරෙහි උපදින වෛරය යටපත් කොට ඊට ප්‍රතිවිරුද්ධ වූ මෛත්‍රිය නැතහොත් මිතුරු ස්වභාවය ඔහු කෙරෙහි පැතිර වීම යි. ඉන් ඔබට අත්වන්නට යන අයහපතේ සාපය දුරුව ගොස් යහපතේ ආශීර්වාදය උදාවෙනු ඇත.

ගුරු උපදේශක - ලලිත් අබේසේකර

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

'කුරා කුඹයකුටවත් වරදක් නොකරපු ඒ මනුස්සයට ඔය සිද්ධ වුණේ නම් පූරුවේ කරපු කරුමයක් තමයි.' කාට හෝ සිදුවූ විපතක් සම්බන්ධයෙන් ඔබේ මුවිනුත් මෙලෙස බොහෝ වාරයක් පිටවී තිබෙනු නිසැකය. හැම දේකටම මුල පෙර කරන ලද අකුසල්ද යන්න ගැන අපි සවිස්තරව කතා කරමු.

### අචින්තනීය ධම්ම

බුදු දහමේ අචින්තනීය ධම්ම නමින් ධර්මතා හතරක් තිබේ. 'අචින්තය' යනු සිතා ගත නොහැකි චින්තන විෂය ඉක්මවා ගිය යන අරුත දෙන වචනයකි.

# අපට විපත් පැමිණෙන්නේ පෙර කළ කර්ම නිසාද



ඒ බුද්ධ විෂය, සෘද්ධි විෂය, කම්ම විෂය හා ලෝක විෂයයි.


චිත්ත විෂයට ගෝචර නොවන ධර්ම හෙවත් අචින්ත ධම්ම සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයාට තබා කෙලෙසුන් නැසූ රහතන් වහන්සේලාටවත් සිතා නිම කළ නොහැකි බව සහ අවසන් නිගමනයකට එළඹිය නොහැකි බව කම්ම සාහිත්‍යය විමසන විට පැහැදිලි වේ.

### බුද්ධ විෂය

බුදුරජාණන් වහන්සේගේ ගුණ මෙනෙහි කිරීම හෝ බුදු බව ලද උත්තමයකුගේ මානසික තත්ත්වයන් පිළිබඳව නිගමනයකට එළඹීම සාමාන්‍ය පුහුදුන් මනුෂ්‍යයකුට කළ හැක්කක් නොවේ. බුදුවරයකු තවත් බුදුවරයකුගේ ගුණ කල්පයක් පුරාම ප්‍රකාශ කළත් කල්පය අවසන් වනු මිස බුදු ගුණ කියා අවසන් කළ නොහැකි බවත් දක්වේ. එය බුද්ධ විෂයයි.

### සෘද්ධි විෂය

සිත දියුණු කරගත් උතුමන්ට දක්විය හැකි සෘද්ධි ප්‍රාතිහාර්යය ඒ ඒ පුද්ගලයාගේ චිත්ත විෂයන්ට අනුව වෙනස් විය හැකිය. සෘද්ධිමතකුට ඇති එම බලයද සාමාන්‍ය පුහුදුන් පුද්ගලයකුට විෂය නොවේ. ඒ සෘද්ධි විෂයයි.



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

## ලෝක විෂය

මේ විශ්වය පිළිබඳව සිතන්නට යාම එහි කෙළවර ගැන සිතීම ආදිය ලෝක විෂයයි. ලෝක විෂය ගැන සිතීමද කෙනකු උන්මාදයට පත්කරවිය හැකි කාරණයකි. අද අපේ මාතෘකාව අචින්තනීය කම්මවලට අයත් කම්ම විෂය පිළිබඳවයි.

## කම්ම විෂය යනු කුමක්ද?

කම්ම විෂය යනු කර්මය ගැන දැන ගැනීමය. කර්මය නමැති විෂය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත හැක්කේ බුදුවරයකුට පමණි. කර්මය පිළිබඳ නිවැරදි අවබෝධයක් නැති ඇතැම් දෙනා සියල්ල කර්මය නිසා සිදුවන බවට විශ්වාස කරති. එයද නරක විපාකයක් එල දෙන විට පමණි. නිදසුනක් ලෙස මෙහි මුලින්ම සඳහන් කළ පරිදි ලෙඩක්, දුකක්, පීඩාවක් හෝ කිසියම් අනතුරකට, ආපදාවකට මුහුණ දෙන්නට සිදුවූ විට, බලාපොරොත්තු කඩවීමකට ලක්වූ විට **"මේක මගේ කරුමය"** යැයි ඒ පුද්ගලයා පවසනු ඇත.

මේ අනුව පැහැදිලි වන කරුණක් තිබේ. එනම් කර්මය යන වචනය බොහෝ දෙනා හඳුනාගෙන තිබෙන්නේ අසුබවාදී දෙයක් ලෙසය. එනිසා නරක කර්මයක් විපාක දෙන විට කර්මය යැයි කියන්නට මිනිස්සු පුරුදු වී සිටිති.

නමුත් කර්මය හොඳ සහ නරක යන විපාක දෙකම සහිත ක්‍රියාවකි. මෙකල බොහෝ දෙනා කර්මය ලෙස හඳුනාගෙන තිබෙන්නේ, කර්මය නොව කර්ම විපාකයයි.

නමුත් කර්මය යනු අප සචේතනිකව කරනු ලබන ක්‍රියාවකි. **"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි"** යනු එයයි. සචේතනිකව හෙවත් සිතා මතා කරනු ලබන ක්‍රියාව හොඳ දෙයක් නම් හොඳ විපාකත්, නරක නම් නරක විපාකත් අත්වනු ඇත. ඒ අනුව නරක විපාකය පමණක් කර්මය ලෙස හැඳින්වීම වැරදි අර්ථකථනයකි.

කර්ම විපාකය ඇති වන්නේ තමන් සචේතනිකව කරන ලද ක්‍රියාවෙහි ප්‍රතිඵලයක් ලෙසය. එසේ නම් කර්මයට තමන්ගේ ඇති දායකත්වයෙන් මිදෙන්නට කිසිවකුට නොහැකිය. නමුත් කර්මය වෙනස් කරගැනීමට පුළුවන. ඒ හැකියාව ඇත්තේද තමාටමය.

කර්ම විපාක දෙන අවස්ථාවලදී හඬා වැටීමෙන්, පසුතැවිලි වීමෙන් විපාක දීම නතර කළ හැකි නොවේ. කළ යුත්තේ තමන් අතින් දැනුවත්ව සිදුවූ නරක කර්මවලට මුහුණ දිය හැකි හොඳ කුසල ශක්තිය දියුණු කරගැනීමය.

මේ තත්ත්වය නිසි ලෙසින් තෝරා නොගත් අය සියල්ල කර්මයෙන් සිදුවන බවත්, කර්මයෙන් බේරී සිටීමට නොහැකි බවත් විශ්වාස කරති. නමුත් බුදුරජාණන් වහන්සේ 'සබ්බං පුබ්බකේත හේතුවාදය' එනම් සියල්ල පෙර කළ පින් පව් අනුව බව ප්‍රතික්ෂේප කළ සේක. කර්ම විපාකය යනු පුද්ගලයාගේ ක්‍රියාකාරීත්වයට උපකාර වන නියාම ධර්ම පහෙන් එකක් පමණි.

ලෝකය තුළ ජීවත් වන මිනිසුන්ට මුහුණ දීමට සිදුවන සියලුම දුක් වේදනා අතීතයේ කරන ලද අකුසලවල විපාක නොවේ. අතීතයේ කරන ලද අකුසලුත් තිබිය හැකිය. නමුත් වර්තමානයේ තමන්ගේ නොසැලකිලිමත්කමේ විපාක ලෙසද අපට නොයෙකුත් කරදර දුක් වේදනාවලට මුහුණ දෙන්නට සිදුවෙයි. ඒවායින් වැළකීමට අවශ්‍ය වන්නේ තමාගේ සිහි නුවණය.

උදාහරණයක් මගින් මෙය පැහැදිලි කරගනිමු. සෘතු නියාමයට අනුව සිදුවන මහ වැසි වැටෙන සමයක ඔබ කුඩයක් රහිතව පාරේ ගොස් වැස්සට තෙමෙන්නට පුළුවන. එහි ප්‍රතිඵලයක් ලෙසට ඔබට සෙම්ප්‍රතිශ්‍යාව සෑදී උණ වැළඳුණේ යැයි සිතන්න. වැසි වැස්සේ ඔබේ කර්මය නිසා නොවේ. එය සෘතු නියාමයට අනුව සිදුවූවකි.

ඔබ වැසි වැටෙන සමයක සිහි නුවණින් කටයුතු කළා නම් නිසැක වශයෙන්ම කුඩයක් රැගෙන මගට බසිනු ඇත. නමුත් ඔබ කුඩයක් ගෙන නොගිය නිසා වැස්සට තෙමී ඔබට උණ වැළඳිණි. උණ වැළඳුණේ කර්මය නිසා නොවේ. කුඩයක් ගෙන යන්නට ඔබ සැලකිලිමත් නොවූ නිසාවෙනි.

**නියාම ධර්ම පහක්** තිබෙන බව ඉහත කීවෙමු. එනම් **කම්ම නියාම, බීජ නියාම, සෘතු නියාම, චිත්ත නියාම සහ ධම්ම නියාමයි.** කර්ම විපාක නිසා හටගන්නා රෝග **කම්ම විපාක ජා අබාධා** ලෙස ගිරිමානන්ද සූත්‍රයේ දක්වේ. මේවා කර්ම නියාමය නිසා හටගන්නා ආබාධයි. නමුත් සමහරු තමාගේ නොසැලකිල්ල නිසා හටගත් රෝගද කර්ම නියාමවලට බැර කිරීමට උත්සාහ දරති.

කම්ම නියාමයේ ප්‍රධාන කොටස් දෙකක් තිබේ. **ඒ ක්‍රියාව සහ විපාකය** ලෙසිනි.

ක්‍රියාව යනු වර්තමානයේ කරන ක්‍රියාකාරකම්ය. විපාක යනු අතීතයේ කරන ලද කර්මවල විපාකයි.


දුම්පානය නිසා යම් පුද්ගලයකුට පෙනහලු පිළිකාවක් හට ගත්තේ යැයි සිතන්න. එය ඔහුගේ පවුලේ අය කරුමෙට හැදුණු ලෙඩක් යනුවෙන් හැඳින්විය හැකි වුවත් ඇත්තටම එය කර්මය නිසා නොව, වර්තමානයේ ඔහු විසින් කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලයකි. ඒ අනුව එය කම්ම විපාක ජා ආබාධ ගණයට නොවැටෙන අතර එය අයත් වන්නේ **විෂම පරිහාර ජා ආබාධා** ගණයටය. කෙනකු වර්තමාන ජීවිතය සැලකිල්ලෙන් ගත කරන්නේ නම් දුකට පත්විය හැකි බොහෝ අවස්ථා මගහැර ගත හැකිය. කුසල කර්ම වැඩි වැඩියෙන් කරන විට අකුසල කර්ම යම් පමණකට වළක්වා ගැනීමට පුළුවන.

බුදු දහමට අනුව කර්මය, කර්ම විපාකය වැනි දේවල් පුහුදුන් පුද්ගලයන්ට විෂය වන හෝ අවසන් නිගමනයන්ට එළඹිය හැකි කරුණු නොවේ. කර්මය හා කර්ම විපාක දීමේ රටාව පිළිබඳව අනවශ්‍ය ලෙස සිතන්නට යාම මනස ව්‍යාකූල කරවන හේතුවකි. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ **"කම්ම විසයෝ භික්ඛවේන චින්තෝසබ්බෝ - යෝ චින්තෙය්‍යය උන්මාදස්ස විඝාතස්ස භාගී අස්ස"** ලෙසය. එහි අදහස නම් මහණෙනි, කර්ම විෂය නොසිතිය යුතුය.

**"යමෙක් එය සිතන්නේ නම් එය එම පුද්ගලයාගේ උන්මාදයට නොසන්සුන් බවට හේතු වේ"** යන්නයි.

ඒ අනුව වර්තමානයේ සිදුකළ වැරදිවලට විපාක ලැබෙන විට එය අතීතයේ කළ කර්ම ලෙස හුවා දක්වන්නට යන්නේ නැතිව වර්තමානයේ කුසලයට නැඹුරුව අකුසල කර්ම විපාක මැඩ පැවැත්වීම වඩා හොඳ පිළිවෙළ වේ.

**පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි**



# අස්ගිරි තල්පත හා ගලගම මහ නාහිමි

ලක්දිව ශාසන ඉතිහාසය විමසීමේදී මහා විහාරයන්ට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ඒ අතර සියවස් හතක ප්‍රෞඪ උරුමයක් සහිත ඓතිහාසික අස්ගිරි මහ විහාරය මේ දක්වා කාලය තුළ මෙරට ශාසන ඉතිහාසය හා බෞද්ධ ශාසනය වෙනුවෙන් ඉටුකර ඇත්තේ අමිල මෙහෙවරකි.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය මිහිඳු මාහිමියන් විසින් මෙරටට වැඩම කරවූ අවස්ථාවේ සිට මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද අවස්ථාව දක්වා එම ශ්‍රී සද්ධර්මය පැවැත එනු ලැබුවේ මහා සංඝරත්නය විසින් මුඛ පරම්පරාවෙනි.

සියවස් කිහිපයක් තිස්සේ බැබළීමට ලක්වූ ලක්දිව බුදු සසුනට වළගම්බා රාජ පාලන සමයේදී එනම් ක්‍රිස්තු වර්ෂ 104 දී පමණ ඇතිවූයේ අභාග්‍ය තත්ත්වයකි. විදේශීය ආක්‍රමණ හා දුර්භික්ෂ නිසා රටවැසියන් හා මහා සංඝරත්නය මහත් අසීරුතාවට පත්විය. විපතට පත් ඇතැම් භික්ෂූහු රට අතහැර ද ගිය අතර මේ නිසා මුඛ පරම්පරාගතව ගෙන ආ ත්‍රිපිටක ධර්මය අභාවයට පත්වීමේ අවදානමක් මතුවිය.

උතුම් ශ්‍රී සද්ධර්මය රැකගැනීමේ අරමුණින් කුන්තගත්ත තිස්ස මහ රහතන් වහන්සේ ප්‍රධාන පන්සියයක් මහා සංඝරත්නය මාතුල දනව්වේ ජනපදාධීශ්වර මන්ත්‍රීශ්වරයාණන්ගේ මහතා උපකාර සහිතව මාතලේ අළුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට කටයුතු කළහ.

අස්ගිරි තල්පතට අනුව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු කුන්තගන්ත තිස්ස මහ රහතන් වහන්සේ දිඹුලාගලට වැඩම කොට ආගමානුකූල ධ්‍යාන සුවයෙන් වැඩ විසූහ. ඒ බව දත් වළගම්බා රජ දිඹුලාගලට පැමිණ භාවනා කුටි, සක්මන් මළු, පොකුණු ආදිය කරවා භික්ෂූන් වහන්සේට වැඩ විසීමේ පහසුකම් සහිතව දිඹුලාගල ආරණ්‍ය සේනාසනය ඉදි කරන ලදී.

ඒ අයුරින් එද දිඹුලාගල වැඩ සිටියේ අස්ගිරි මහා විහාරයට සම්බන්ධ ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා පිරිසකි. අසගල් වෙහෙරෙන් භික්ෂූන් වහන්සේ වැඩම කළ නිසා අස්ගිරි යන නාමය භාවිතයට පැමිණ ඇත. පාලි බසින් අච්ඡාගිරි එනම් වලසුන් සහිත වනාන්තරය අර්ථවත් වන පරිදි වළස්ගම යනුවෙන් බිඳී අස්ගිරි යන නාමය සඳහන් වී තිබේ.

වලස්ගල යන්න පාලි භාෂාවෙන් යොදන විට අච්ඡගිරි නම් වේ. එය සිංහලයට පෙරළන විට අස්ගිරි වන අතර එය පාලි බසින් භයගිරි යනුවෙන් පරිවර්තනය වේ.

පොළොන්නරු යුගයේ රට පාලනය කළ මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාලන කාලයේදී දිඹුලාගල සේනාසනයේ මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේ ප්‍රධාන ශාසන භාරධාරී මහ තෙරුන් වහන්සේලා අනූනමයක් වැඩ සිටි බව අස්ගිරි තල්පතේ සඳහන් වේ. මහා කාශ්‍යප තෙරුන් වහන්සේගේ උපදෙස් පරිදි පරාක්‍රමබාහු රජතුමාගේ මූලිකත්වයෙන් භික්ෂූන් සමගි කොට දුස්සීල භික්ෂූන් ශාසනයෙන් ඉවත් කොට බුද්ධ ශාසනය පිරිසිදු කළේය.

ක්‍රිස්තු වර්ෂ 1217 දී පොළොන්නරුවට පැමිණි කාලිංග මාඝ නමැති ආක්‍රමණිකයා එකල එහි සිටි පරාක්‍රමබාහු රජු ඝාතනය කොට වෙහෙර විහාර විනාශ කරන්නට කටයුතු කළේය. ඒ සමයේ දිඹුලාගල වැඩ විසූ බුද්ධවංශ වනරතන මහ තෙරුන්ගේ අතවැසි මේධංකර මහ තෙරුන් ඇතුළු භික්ෂූන් පිරිසක් වත්හිමි විජයබාහු රජුගේ රැකවරණ ඇතිව දඹදෙණි නුවරද උන්වහන්සේගේ අතවැසි දීපංකර තෙරුන් ඇතුළු භික්ෂූන් සුබ ඇමැතිවරයාගේ රැකවරණය ඇතිව යාපහුවේද වැඩ විසූහ.

යාපහුවේ සුබ ඇමැතිවරයා එම භික්ෂූන්ට අච්ඡ පබ්බත හෙවත් වළස්ගම නම් ස්ථානයේ සේනාසනයක් ඉදිකොට පූජා කරන ලදී. ඒ අතර කාලිංග මාඝ නම් ආක්‍රමණිකයා පරදවා වත්හිමි විජයබාහු කුමාරයා වර්ෂ 1236 දී දඹදෙණිය රාජධානිය පිහිටුවා ගත්තේය.

ඉන්පසු රාජධානිය බවට පත්වුණේ කුරුණෑගලය. එහි පාලනය කරන ලද සිව්වන පරාක්‍රමබාහු රජතුමා උගත් කෙනෙකි. එතුමා කටුපුළු නුවර ආරක්ෂක කඳවුරක් සෑදීමට තමන්ගේ බෑණා වූ සිරිවර්ධන ඇමැතියට නියම කළේය. ඇමැතිවරයා ඒ අනුව සීමා ප්‍රාකාර බැඳ සුදුසු බලකොටුවක් සෑදුවේය. සෙන්කඩගල නුවර මුල් නම සිරිවර්ධන පුරයයි. ඒ ඇමැතිවරයා නගරය නිර්මාණය කළ නිසා ඒ නම තැබීය. ඒ නගරයේ ආරණ්‍ය සේනාසනයක් ඉදි කිරීමට ඇමැතිවරයා කටයුතු කළේය. අස්ගිරි තල්පතේ සඳහන් වන පරිදි සේනාසනය ඉදිකිරීමට සුදුසු ස්ථානය එතුමාට සිහිනයෙන් පෙනුණ අතර එය වර්තමානයේ මහනුවර ත්‍රිත්ව විද්‍යාලය පිහිටි ස්ථානයේ ඉදිකොට ඇත. අස්ගිරි මහා විහාරයේ කහවත්තේ රාම තෙරුන් වහන්සේ වැඩ සිටි රාම විහාරය අදද එහි දක්නට ඇත.

යාපහු නුවර අස්ගල් විහාරයෙන් භික්ෂූන් වහන්සේ වැඩම කොට නව ආරණ්‍යයට වැඩම කරවීමට රජතුමා තීරණය කළ අතර ඒ අනුව දිඹුලාගල පරපුරට අයත් පලාබත්ගල ධර්මකීර්ති මහ තෙරුන් ප්‍රධානත්වයෙන් රැස්වූ භික්ෂූන් වහන්සේ කටපුළු දනව්වේ සෙන්කඩගල නුවරට වැඩමවීමට සුදුසු භික්ෂූන් පිරිසක් තෝරා ගන්නා ලදී.


සෙන්කඩගල සිරිවර්ධනපුර මහනුවර අස්ගිරි මහා විහාරය ආරම්භ කළේ වර්ෂ 1312 දී වෙසක් මස මැදි පොහොය දින එනම් මීට වසර 700 කට පෙරදීය. අනුරාධපුර මහා භික්ෂු පරම්පරාවෙන් පැවැති එන භික්ෂූන් මුලින්ම වැඩම කළේ අස්ගිරි සේනාසනයටයි.

## අස්ගිරි පාර්ශ්වයේ මහානායක හා අනුනායක පදවි

දීර්ඝ කාලයක සිට විකාශය වූ උභය මහා විහාරයේ මහා නායක අනුනායක පදවි මාහිමි, මහ තෙර, ගණනායක යන නම්වලින්ද හැඳින්විණ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා 1753 දී සිදු කළ සියම් උපසම්පදාවෙන් පසු මහා නායක තනතුරු දෙකක් අස්ගිරි හා මල්වතු පාර්ශ්වයට පත්කරමින් විජිනිපත් දෙකක් පිළිගන්වා තිබේ. එම පදවිය උප සංඝරාජ තනතුරක් වශයෙන්ද තිබුණු බව මන්දාරම්පුර පුවතේ සඳහන්ය. අතීතයේදී මෙම තනතුරු පිරිනමන ලද්දේ රජවරුන් විසිනි.

මහා නායක හිමියන් පත්කර ගැනීමේ කටයුතු 1853 දී ඉංග්‍රීසි පාලකයන් විසින් එය මහා සංඝ රත්නයට පවරා දෙන ලදී. ඒ අනුව අති පූජ්‍ය යටවත්තේ සුවණ්ණජෝති හිමිපාණන් වහන්සේ

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''



## හිමි සඳ වැඩමකෙරුවා නිවනේ මගට

හමනා සුළං රොද සෙංකඩගල ගුවනේ
සුසුමන් හෙළනවා දුකකින් හිමි සඳුනේ
හිමිගේ දහම් පදවල රස හිතරැඳුනේ
කිමදෝ හනික මේ ගමනට පිටත් වුණේ

බැතිබර සිනා මුවකමළේ පුරවාපු
දළදා හිමිගෙ අභියස පිං රැස් කරපු
ගුණනැන බලෙන් මිහිකත මත බබලාපු
සඟ රජු නුඹය හිමි සඳුනේ මම දැකපු

බුදු සසුනේම චිරකල් ගමනම සිතුව
පවසා නිතර හරි දෙය යටහත් නැතුව
ලැබුවත් අපේ හිමියෝ නිවනම පැතුව
හෙට දින දැනෙයි කාටත් හිමි නැත අඩුව

සුවහස් දනන්ගේ හදවත් සතුටුකොට
සදහම් දෙසූ හැටි සිහිවෙනවා සැමට
තව එක දහම් පදයක් දෙසමින් ලොවට
හිමි සඳ වැඩමකෙරුවා නිවනේ මගට

කාටත් මිහිරි වදනින් අමතා නිතර
නොබියව තබා පායුග හෙළ දැය අතර
අනියත දහම පෙන්වා මේ භව කතර
නිවනට යන්න ඉක්මන් විය දුක අතැර


*සගම අනෝමදස්සි හිමි*

පාර්ශ්වයේ ප්‍රථම මහානායක හිමිපාණන් වහන්සේ විය.

### මහා නාහිමි තනතුරු හා එහි බලතල

ලක්වැසි භික්ෂූන්ට නායකත්වයට අදාළ මහ තෙරු, මහාස්වාමි, සංඝරාජ යන තනතුරු රාජ අනුග්‍රහයෙන් පත්කිරීම ඇරඹුණේ පොළොන්නරු රජ සමයේදීය. පළමුවන පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ ලතා මණ්ඩපයේදී සියලු භික්ෂූන් මැද දිඹුලාගල මහා කාශ්‍යප තෙරණුවන්ට මහා ස්ථවිර පදවි පිරිනමා ඇත. දිඹුලාගල මහා හිමියෝ අඛණ්ඩව පැවැති ලක්දිව සඟ පරපුරේ 136 වැනි මහ තෙරණුවන්ය. අනුසාමි යනුවෙන් භික්ෂූන්ගේ දෙවන නායක තනතුරක්ද අධ්‍යාපන කටයුතු සිදු කරන ස්ථානය සඳහා නායක තනතුරුද තිබේ. මහාසාමි (මහාස්වාමි) හෙවත් මාහිමි, මහ තෙර, මූලායතනාධිපති තනතුරු පත්කළ යුතු ආකාරය පිළිබඳ නිර්දේශ දඹදෙණි කතිකාවතේ ඇතුළත්ය.

එම කතිකාවතේ විස්තරවලින් පැහැදිලි වන්නේ මාහිමි තනතුරට අමතරව ග්‍රාමවාසී මහ තෙර ආරණ්‍යවාසී මහ තෙර යනුවෙන් තනතුරු දෙකක්ද එකල පැවැති බවයි. නිවැරදි පිළිවෙත් ඇතිව මැදිහත් සිතින් කටයුතු කරන්නට හා සෙසු සංඝයා හික්මවීමට සමත් භික්ෂූන් තෝරාගෙන මහරජුගේ ප්‍රධානත්වයෙන් ග්‍රාමවාසී භික්ෂූන්ගේ මහා ස්ථවිර පදවියට පත්කිරීමට සුදුස්සන් තෝරා ගනු ලබයි. මහා ස්වාමි තනතුරු පුරප්පාඩු ආවොත් මහ තෙර දෙනමගෙන් එක් නමක් එම තනතුරට තෝරා ගත යුතු වෙයි.



මහනුවර රාජ පාලන සමයේදී අස්ගිරි මල්වතු මහා විහාරවල නායක තනතුරු නම්කොට තිබුණේ ගණනායක නමිනි. 1753 වසරේ උපසම්පදාව යළි පිහිටුවීමෙන් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වැලිවිට ශ්‍රී සරණංකර මාහිමියන් සංඝරාජ තනතුරු සඳහා පත්කරන ලදී. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ ලක්දිව මහා විහාර භික්ෂු වංශයේ නායක තනතුරු දරූ 177 වන මහ තෙරණුවෝ වෙති. අස්ගිරි මල්වතු මහා විහාර දෙකට මහානායක පදවි පත්කිරීමද සිදු කරන ලද්දේ රජු විසිනි. එම පදවි උපසඟරජ යනුවෙන් හැඳින්විණි.

අස්ගිරි මල්වතු වශයෙන් භාවිතයට පැමිණියේ පිළිවෙළින් වනවාසී හා ග්‍රාමවාසී සම්ප්‍රදයන්ගෙනි. රජු විසින් දිවයින පුරා විහාරස්ථාන 2400 බැගින් මහා විහාරවලට බෙදා දෙනු ලැබීය. දළදා වහන්සේගේ ආරක්ෂාවත්, භික්ෂූන් වහන්සේලා හා පන්සල්වල පාලනයත් ඒ තුළින් ක්‍රමවත් විය.

### ගලගම ශ්‍රී අත්ථදස්සි අස්ගිරි මහානාහිමි

උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහානාහිමියන්ගේ අපවත්වීමෙන් පසු ගලගම ධම්මසිද්ධි ධම්මානන්ද අත්ථදස්සාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහා නායක ධුරයට පත්වූහ. 1922 මාතලේ ගලගමදී උපන් උන්වහන්සේගේ ගිහි නම වූයේ කුලතුංග මුදියන්සේලාගේ කිරිබණ්ඩාරය. 1936 දී පැවිදි බිමට පත් මුන්වහන්සේ මාතලේ ශ්‍රී ධම්මරාජ පිරිවෙනේ මූලික අධ්‍යාපනය ලදහ. සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ භාෂා පිළිබඳ ප්‍රමාණික උගතකු වූ අත්ථදස්සි මහා නාහිමියෝ 1950 දී අභිධර්ම උපාධිය හා ත්‍රිපිටකාචාර්ය උපාධියද හිමිකර ගත්හ.

එසේම 1950 වසරේදී මජ්ඣිම භාණක උපාධියද ලබාගත්හ.


මහා විහාර සම්ප්‍රදාය නිසි ලෙස රැකගනිමින් වත්මන් හා අනාගත භික්ෂු පරපුරට ඒ සඳහා පූර්වාදර්ශ දෙමින් වැඩ සිටි ගලගම ශ්‍රී අත්ථදස්සි මහා නාහිමියෝ ධර්ම විනයධර මහ තෙර නමක් ලෙස ගිහි පැවිදි කාගේත් ගෞරවයට පාත්‍රව සිටියහ.

(ගලගම ශ්‍රී අත්ථදස්සි මහා නාහිමියන්ට මහානායක ධුරයේ අක්තපත්‍ර ප්‍රදානය කිරීම නිමිත්තෙන් ලියන ලද මෙම ලිපිය මහා නාහිමියන්ට ගෞරව පිණිස පළ කරමු.)

**අස්ගිරි මහා විහාරයීය කාරක සංඝ සභික**
**මැදගම ධම්මානන්ද හිමි**

# පූජනීය දිවියක උදාර මතකය


## අපවත්වී වදාළ අස්ගිරි පාර්ශ්වයේ අතිපූජ්‍ය ගලගම ශ්‍රී අත්ථදස්සාභිධාන මහානායක මාහිමිපාණන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා කිහිපයක්




මහානායක පදවියට පත් වූදා



ජනපති අතින් මහානාහිමියන්ට අක්ත පත්‍රය




නිල අරමේ විවේක සුවයෙන්



සත්ව කරුණාව



මහානාහිමි නිලංග දෑල නිලමේතුමා සමග




තායිලන්තයට සර්වඥ ධාතු වැඩමවීමකදී



නායක පදවි ප්‍රදානයක්



මහානාහිමි නිල ආරාමය විවෘත කළ දා





පදවියට පත්වූදා මහානාහිමිට ආශිර්වාද



මහානාහිමියෝ කතරගම අෂ්ටඵල බෝධිය අබියස

රාමඤ්ඤ නිකායේ මහානාහිමි සමග

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## හරි මග සොයා යමු


අප බොහෝ දෙනා සිතන්නේ බුදු දහමින් ප්‍රකාශ වන්නේ අනිත්‍ය පිළිබඳව පමණක් කියාය. මෙය අප වැරදි විදියට වටහා ගත්තකි. තිලෝගුරු බුදුන් වහන්සේ මරණින් පසු පමණක් නොව මෙලොව ජීවත් වෙද්දිත් සැප හා සතුට විඳිය යුතු නිවැරදි අන්දම ඉතා පැහැදිලිව දේශනා කොට තිබෙන බව අප වටහා ගත යුතුය. අනෙක් අයට හානියක් නොවී සැප විඳිය යුතු ආකාරය උන්වහන්සේ සප්ත අපරිහාණී ධර්මය තුළින් පෙන්වා දී තිබේ. බුදුරජුන් ඉවත දැම්මේ සියලු දේ මගේ කියා අල්ලා ගන්නා ආත්මාර්ථකාමීත්වයයි. ආශාවන් හා කෙළෙස් අත්හරින ලෙසටයි උන්වහන්සේ දේශනා කළේ. නිවන් සුවය ලබන්නට නම් කෙළෙස් ප්‍රහීණ කළ යුතු බව උන්වහන්සේ විවිධ දේශනා මගින් පෙන්වා දී ඇත්තාහ. සංඝයා වහන්සේලාටද මේ නියමය පොදු බව අප අමතක නොකළ යුතුය. එහෙත් වර්තමාන භික්ෂූන් වහන්සේලාගෙන් ඉතා සුළුතරයක් බුද්ධ දර්ශනයට අනුව හැසිරෙනවාද යන්න අද සමාජ ගැටලුවක් බවටද පත්ව තිබෙන බව අපට අමතක කළ නොහැකිය. උන්වහන්සේ දේශනා කළ ජාතිමොක්ඛ සූත්‍රය තුළින් නිවැරදි භික්ෂුව යනු කවුරුන්දැයි ඉතා පැහැදිලිව පෙන්වා දී තිබේ. විනයගරුකව හා ධර්මානුකූලව හැසිරීම භික්ෂූන් වහන්සේට අනිවාර්ය අංගයක් බව ථෙරවාදී බුදු දහමේ ඉගැන්වෙන බව ඉතා පැහැදිලියි. පසුගියදා සසුනට නොගැලපෙන සිදුවීම් කීපයක් සිදු වුවද, ඉතාමත් සිල්වත්, ගුණගරුක හා සුපෙක්ෂාකාමී, දූන උගත් භික්ෂු පරපුරක් අප රට තුළ සිටීම බෞද්ධයන් හැටියට අපට විශාල ආඩම්බරයක් බවද මෙහිදී අවධාරණය කළ යුතුමය. සමාජය යහමගට ගැනීමට උන්වහන්සේලා මනා කැපවීමෙන් ක්‍රියා කරන ආකාරය ගැන අපේ ප්‍රසාදය එම භික්ෂූන් වහන්සේලාට අප පුද කර සිටිය යුතුමය. සඟ සසුන බැබළෙන්නේ උන්වහන්සේලා නිසාය.

මෙහිදී අවසන් වශයෙන් අවධාරණය කළ යුතු තවත් වැදගත් කරුණක් ඇත. එනම් නීති රීති පැනවීමෙන් බුදුන් දෙසා වදළ නිර්මල ධර්මය සොයන්නට ආණ්ඩුව උත්සාහ ගැනීම ගැන තවත් වරක් සිතා බැලිය යුතු බවයි. මෙහිදී ගරුතර මහානායක ස්වාමීන් වහන්සේලා ඇතුළුව දූන උගත් ගිහි පැවිදි දෙපාර්ශ්වයේම අදහස්වලට ඇහුම්කන් දීම කළ යුතුමය. ■

# සමනළ කන්දට
# ලැබුනේ කො

ශ්‍රී පාද පද්මය පිහිටි සමනල කන්ද උස අ
පැරණි සංස්කෘත ග්‍රන්ථවල මෙය ලංකා
රෝහණ යන නම්වලින් හඳුන්වා ඇත.
බාල රාමායණ කාව්‍ය වීමංසා, අනර්ඝව රාඝ ය
'රෝහණ පබ්බත' ලෙස දැක්වෙයි. දඹදිව බුද්ධග
'ලංකා පබ්බත' යන නම එයි. මහාවංශ ටීකාව
දෙවි වසන බැවින් මේ කන්ද සුමනකූට නම්
පාද, සමන්තකූට, සුමනගිරි යන නම් ලාංකික
දැක්වෙයි.

දකුණු ඉන්දියාවේ ලියවුණු 'මණිමේඛලා'
කාව්‍යයේ මේ කන්ද 'සමනොළි' ලෙස දැක්වෙයි



"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ

# ඒ නම

# හාමද ?

7360 වෙයි.
බ්බත හා
ස්කෘත ග්‍රන්ථ වූ
ග්‍රන්ථවල මෙය
ශිලා ලිපියේ
ව සුමන
සමනල, ශ්‍රී
කතාවල

හින්දූන් 'ශිවන්ඔලි පාදම්' නමින්ද අරාබි හා මුස්ලිම්වරුන් 'බබාද මලෙයි' නමින්ද හඳුන්වයි. පෘතුගීසි හා ඕලන්ද මූලාශ්‍රවල 'පීකෝද ඇඩම්' හා 'ඇඩම්ස්පීක්' හෙවත් 'ආදම්ගේ කන්ද' නමින් එයි.


මේ කන්දට සමනළ යන නම ලැබීමට හේතු කවරේද?

1. ශ්‍රීපාද කඳුවැටියට අරක් ගත් සමන් දෙවිගේ ඇල්ම බැල්ම වාසය ඇති බැවින් සමනළ යන නම යෙදෙයි. සමන් දෙවි සිහිවීමට මේ නම භාවිත වෙයි.

2. සමනළ මුදුනේදී දුවැන්ත සුළං ප්‍රවාහයක් මුහුද අද්දර සිට රට මැදට විහිද යයි. මේ මුහුදු සුළං ප්‍රවාහය ගහකොළ අඩු සමනළ කඳු මුදුනේ හැපී බෙදී විසිරී යයි. සුළඟ බෙදී විසිරී යන කඳුගැටය සමනළ වූ බව එක් අදහසකි. නළ හෙවත් සුළඟ සමව බෙදී යන ස්ථානය සමනළ වූ බව ඉන් කියැවේ.

3. ලංකාවේ සමනලුන්ගේ සංක්‍රමණ මාර්ග තුනක් හඳුනාගෙන ඇත. ඉන් එකක් වන්නේ රට මැද සිටින සමනලුන් ශ්‍රී පාද කඳුවැටිය දෙසට සංක්‍රමණය වීමයි. සමනලුන් ශ්‍රීපාද වන්දනාවේ යන බව ගැමි බෞද්ධයෝ විශ්වාස කළහ. ගහකොළ හිස් හිරු එළියෙන් දවල්ට හොඳින් බැබළෙන සමනළ කඳු මුදුන දෙසට දිවා කාලයේද නොනිවී දැල්වෙන දහස් ගණන් පහන් නිසා රාත්‍රී කාලයේද සමනළ රංචු ශ්‍රීපාද කඳුවැටිය දෙසට පියාඹා යති. ඉතා කෙටි ජීවන කාලයක් හිමි සමනල්ලු රට මැද සිට ආලෝකය දෙසට දිවා රෑ පියාඹා යති. සමනළ කන්දට ඒ නම ලැබීමට මෙය ප්‍රධාන හේතුවක් විය.

**එස්. කේ. ජයවර්ධන**



ූ ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



සෝවාන්, සකෘදගාමී යනාදී සතර මග, සතර ඵල ලැබූ උතුමෝ ආර්ය පුද්ගලයන් නමින් හඳුන්වති. තෙරුවන් හඳුනාගත් තිසරණගත පුද්ගලයෝ ආර්ය ශ්‍රාවක වෙති. යම් මාර්ගඥානයක් යමකුගේ සන්තානයේ පහළ වුවහොත් එම මාර්ගය චිත්ත වීථිය අවසානයේම ඵල සිත් පහළවීම ධර්මතාවකි. (මෙය අකාලික නමින්ද හැඳින්නේ.) මෙය චිත්ත නියාමයකැයිද කිව හැකියි. ඒ අනුව අනාගාමී පුද්ගලයා හට අරිහත් මාර්ග ඥානය පහළ වන තෙක් හේ අර්හත් මාර්ගස්ථයෙකි. අරිහත් මාර්ග ඥානය පහළ වූ පසු ඒ හා සමගම ඵල ඥානද පහළ වන හෙයින් හේ අරිහත් ඵලයට පත් රහතන් වහන්සේ නමකි. බොහෝ ගිහි පැවිදි උගතුන් මාර්ගඵල පිළිබඳව ස්ව මත බුද්ධ දේශනාව ලෙස දක්වන අවස්තා අසන්නට හා කියවන්නට ලැබේ. එය ධර්ම විරෝධී කියමනකැයි මා සිතමි. අනාගාමී ආර්යයන් වහන්සේලා පවා (ගිහි) ගිහි ගෙයි විසූවද, බ්‍රහ්මචාරීව වාසය කරන පිරිසිදු පුද්ගලයෙකි. සමවත් සුව විඳින්නෙකි. (ඝටිකාර සූත්‍රය, විශාඛ ධම්මදින්න ප්‍රවෘත්තිය විමසුම වටී.)

භාවනා පිළිබඳ උපදෙස් දෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා පවා

# අරහත් මාර්ගයට පත් වූ උතුමෙකුට ගිහිගෙයි වාසය කිරීමට බැරිද?

## ප්‍රේම වෘත්තාන්තයකින් කළකිරී මහණවීම නියම අභිනිෂ්ක්‍රමණයද

ඉඟුරුවත්තේ පියනන්ද හිමියන්ගෙන් අසමු.

මාර්ග ඥානය ලබා පසුකලක හෝ පසු දිනක ඵලඥාන ලැබෙන බව සඳහන් කරන බව පෙනේ. මහායාන සම්ප්‍රදාය පිළිබඳව පොත් පත් ලියූ එක්තරා ප්‍රකට මහා තෙරනමක් රහතන් වහන්සේ රහත් බවින් පිරිහීමට ඉඩ තිබේ යයි ලියා තිබෙනු මා දැක ඇත. එක්තරා මහායාන සම්ප්‍රදායක එබඳු කරුණු අන්තර්ගතව තිබුණද බුද්ධත්වයෙන් මොබ ආර්යයන් පිළිබඳ පිළිගැනීමක් නැති එබඳු මත පිරිසිදු ථේරවාදී බුද්ධ වචනය හා එක් නොවන බව භාවනා උපදෙස් දෙන ගුරුවරුන්ට නොවැටහීම ඔවුන්ගේ පරියාප්ති දැනුම පිළිබඳ සැක උපදවයි.

අපගේ සූත්‍ර පිටකයෙහි දැක්වෙන පරිදි ගිහි රහතන් වහන්සේ නමක් පිළිබඳ (ගිහි ගෙයි විසූ) දැක්වෙනුයේ සුද්ධෝදන රජතුමාගේ කතා ප්‍රවෘත්තියයි. එතුමෝද රහත් වීමෙන් අනතුරුව පිරිනිවන් පෑ බව දැක්වේ. බාහිය දාරුචීරියද පරිබ්‍රාජකයෙහි ශාසනික පැවිද්ද ලැබීමට පෙර හදිසි අනතුරකින් පිරිනිවියේය.

මෙයට ශත වර්ෂයකට මොබ බුරුම දේශයේ වැඩ සිටි සමථ විපස්සනා භාවනා ක්ෂේත්‍රය පිළිබඳ චිර ප්‍රසිද්ධ සිය ගණන් ධර්ම ග්‍රන්ථ ලියූ ලේඩි සයාඩෝ, වේබු සයාඩෝ, මහාෂී සයාඩෝ වැනි උතුමෝ අනාගාමී හෝ රහත් වූ උතුමන් ලෙස බුද්ධිමත් බෞද්ධ ලෝකයා සලකති. උන්වහන්සේලා ලියූ කිසිදු පොත පතකින් යථෝක්ත මගඵල ක්‍රමය සනාථ වන පිටිවහලක් නොලැබේ. නමුත් මෙබඳු ක්‍රමයක් තිබේ. සැදැහැයෙන් තෙරුවන් සරණ ගිය තැනැත්තා පවා සෝවාන් වීම සඳහා පිළිවෙත් පුරන හෙයින් සෝවාන් මාර්ගස්ථයෙකි. යම් අවස්ථාවක මාර්ගාංග එකවර පහළ වීමෙන් මාර්ග ඥානය පහළ වේ. ඒ සමගම පෙර පසු නොවී ඵලඥානද ඇති වේ. සෙසු මාර්ග තුන පිළිබඳවද මෙම ක්‍රමයමය. මෙම ගාථාවද සැලකිල්ලට ගනු වටී.

**''මග්ගං ඵලංච නිබ්බානං - පච්චවෙක්ඛති චානවා**
**හීනෙ කෙලෙසෙ සෙසාච - පච්චවෙක්ඛති පණ්ඩිතා''**

මෙම ගාථා ධර්මයට අනුවද මාර්ගයට අනතුරුව ඵලය උපදින බව පැහැදිලිය. තියුණු නුවණැතියා යම් අධිගමයකට පත්වුවහොත් තමන් උපදවා ගත් මාර්ගය, ඵලය, නිවන, ක්ෂය වූ කෙළෙස්, අවශිෂ්ට කෙළෙස් යන මෙම කරුණු පස පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා ඥාන පහළ වන බවත් සාමාන්‍ය නුවණැති පුද්ගලයාට මාර්ගය ඵලය හා නිවන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂා සිත් පහළ වන බවත් දැක්වේ.

නියම කලකිරීමක්ද, සාර්ථක අභිනිෂ්ක්‍රමණයක්ද වනුයේ කරුණු කාරණා මැනවින් විමසා අවංක චේතනාවෙන් යුතුව අභිනිෂ්ක්‍රමණය කිරීමෙනි.
කුමන කාරණයක් නිසා හෝ ඇති වූ කලකිරීමකින් බණ භාවනාවකට හෝ පැවිද්දට යොමුවීම යහපත්ය. ප්‍රශංසනීයය. ප්‍රේම වෘත්තාන්තයක් මුල්කොට යම් සාධාරණ හේතුවක් මත අපේක්ෂා භංගත්වයට පත්වීමෙන් ඇතැමකුට ගැඹුරින් කලකිරීමක් ඇතිවිය හැක. එය මතුවට ජීවිතය පිළිබඳ පූර්ණ අවබෝධයක් කරා යොමුවීමට මාර්ග යක්ද විය හැකිය. යහපත් සත්පුරුෂයන්ගේ ඇසුරින් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් බවටද පත්වීමට ඉඩ තිබේ. නමුත් එසේ පැවිද්දට පත්වන ඇතැමෙක් උදාර අදහසින් අභිනිෂ්ක්‍රමණය කළද නිසි ගුරු ඇසු ක් ලබා නොගැනීම, පැවිදි වූ පසු අන්‍යයන්ගේ ගරු බුහුමන් ලැබීම නිසා ඇතිවන උඩඟුව වැනි දුබ තා නිසා තම පැවිදි ජීවිතය සිල්වත්ව, නිර්මලව සතුටුදායක තත්ත්වයෙන් ගත නොකරන අවස බොහෝ විට දක්නට තිබේ. (වැඩි වයසට පත්



"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"

මහණ වන්නන් තුළ) මේ අතරින් ඇතැම් පැවිද්දන් තමා පෙර ගත කළ ගිහි ජීවිතයටත් වඩා පහත් ලාමක කටයුතු කරමින් දෙලොවම පරිහානිය උදාකර ගන්නා අයුරුද දක්නට තිබේ.

තරුණ පක්ෂයේ අය පමණක් නොව මැදුම් විය පවා ඉක්ම වූ ඇතැම් පින්වතුන් අතරද අඹු-සැමි ප්‍රශ්න මත ඇතිවන හෝ මව්පිය දූ දරුවන් අතර ඇතිවන ප්‍රශ්න නිසා පැවිද්දට පත්වන අය බොහෝ සිටිති. එබඳු අය ආරණ්‍ය, භාවනා මධ්‍යස්ථාන වැනි විවේකස්ථාන මේ සඳහා තෝරා ගන්නා ප්‍රවණතා වැඩිය. මා දන්නා එබඳු ආරණ්‍ය සමහරක යථෝක්ත කරුණු මත පැවිදි වීම සඳහා යන පුද්ගලයන් කිසිදු විමසීමක්, පැවිද්ද පිළිබඳ දැනුවත් කිරීමක් නොකොට පැවිදි කරති. ඇතැමුන් නිසි බණ දහම් නූගන්වා පැවිදි කොට ටික දිනකින්



උපසම්පදා කරති. එසේ මහණ උපසම්පදාව ලත් සමහර අය සුළු දෙයකින් පවා ගැටුම් ඇති කොටගෙන ඇතැම් විට පැවිදි කළ ගුරුවරුන්ටද නොදන්වා එබඳු තැන්වලින් පිටවී තැන් තැන්වල ඇවිදින්නන් බවට පත්වේ. අප රට බහුතරයක් ගිහි පක්ෂය භික්ෂූන්ගේ චාරිත්‍ර වාරිත්‍ර, ධර්ම විනය පිළිබඳ නොදන්නාකම නිසාත් මේ රටෙහි සිවුරට ලැබෙන ගෞරවය නිසාත් එබඳු පැවිද්දන්ට තම සිතැඟි පරිදි ජීවත් වීමට හැකියාව තිබේ. මෙබඳු අවස්ථාවක ඇතැම් ආරණ්‍ය සේනාසනවල සිටින අනුශාසකයන් පවා, ගුරුවරයාගෙන් වෙන්වී දඩබ්බර ලෙස කටයුතු කරන එබඳු පැවිද්දන් තම විහාරස්ථානවල ශාසනානුලෝමික නොවන අයුරින් රඳවා ගැනීම නිසාත්, ඔවුන් තව තවත් පැවිද්දට නොගැළපෙන ක්‍රියාවන් කරමින් හැසිරෙති. කිසිදු බණ දහමක් හෝ පැවිදි ආචාර, සමාචාර පිළිබඳ හෝ නිසි දැනුමක් නැති මෙබන්දෝ ඇතැම් විට විහාරස්ථානවල අධිපති බවටද පත්වන අවස්ථා තිබේ. ගුරු පරපුරකින් ඉගෙන ගත් බණ භාවනා ක්‍රමයක් පිළිබඳ ක්‍රමවත් දැනුමක් නැති, පොත පත තරමක් කියවා කරුණු ගැට ගසාගෙන කටයුතු කිරීමේදී උද්ගත වන ඇතැම් ප්‍රශ්න අපට පසුගිය කාල පරිච්ඡේදය තුළ හොඳින් දක්නට ලැබිණි. මේවා ශාසන පරිහානියට මිස ශාසන අභිවෘද්ධියට හේතු නොවේ. ධර්මය නූගත් ගිහියන්ට මේවා තේරුම් ගත නොහැකිය.

යථෝක්ත හේතුන් මත පැවිදි වීම සඳහා පැමිණෙන ඇතැම් දෙනා සුවචව, කීකරුව සිට පැවිද්දද ඇතැම් දෙනා උපසම්පදාවද ලබා ගනී. අනතුරුව මේ අය ගිහි පක්ෂයෙන් ලැබෙන ගෞරව, පුද පූජා නිසා ඒවා වැඩි වශයෙන් ලබාගැනීම සඳහා ස්ථානයක අධිපතියෙක් ලෙස කටයුතු කිරීමේ අසනීපය වැළඳෙති. අනතුරුව ලාමක ආශාවන්ට ගොදුරු වී විවිධ ආක්‍රමණික ක්‍රියා කරමින් පැවිදි පිරිස් මෙන්ම ගිහින් පිරිස් අතරද ගැටුම් ඇති කොටගෙන ගුරුවරුන්ගේ අවවාද නොතකා තව තවත් ස්ථාන සොයා යති. ධර්ම විනය ගැන හෝ භාවනා මාර්ගයක් පිළිබඳව හෝ පැහැදිලි දැනුමක් නොමැති මෙබඳු අය අභිධර්මය, ධර්මය කරමින්, අවිනය විනය කරමින්, නූගත් ගිහියන් මුලා කරමින් ජීවත් වන අවස්ථා තිබේ.

එක්තරා ගිහි මහතෙක් තම බිරිඳ සමග කලකිරී ඇට දඬුවමක් වශයෙන් මහණ වීමට තීරණය කොට (මෙය දැනගත්තේ ඔහු මහණ වී කලකට පසුව ය. එක්තරා ආරාමයකට ගොස් යටහත් පහත්ව එහි ප්‍රධාන භික්ෂුවට තමා පැවිදීම සඳහා පැමිණි බව කියා සිටියේය. ප්‍රධාන භික්ෂුවගේ අවසරය පරිදි ආරාමයෙහි නැවතී හොඳින් වත් පිළිවෙත් කරමින් සිටිනාතර නිතර නිතර ඉක්මනින් පැවිදි වීමට අවශ්‍ය බව අනුශාසක හිමියන් හට කියන්නට විය. උපාසක මහතාට ඉක්මනින් මහණ වීමට අවශ්‍ය නම් ඒ සඳහා සුදුසු තැනකට යන්නට යයි අනුශාසක හිමියන් කීහ. එම තැනැත්තා එතැනින් පිටත්ව ඈත දුෂ්කර ප්‍රදේශයක පිහිටි ආරණ්‍යයකට ගොස් ටික දිනකින්ම පැවිදිව දෙමසකින් පමණ තමන් ගිහි කල පදිංචි ස්ථානයට නුදුරු ගල්ලෙනක නැවතී පිණ්ඩපාතයෙන් යැපෙමින් ටික කලක් ගත කළේය. අනතුරුව ගිහි ජීවිතයේ බිරිඳ සමග නැවතත් සමීපවීම නිසා මිනිසුන්ගේ නින්දා අපහාසවලට ලක්ව පසුව සිවුරු හැර සුපුරුදු ජීවිතයටම පත්විය. මෙං බිරිඳගෙන් පලි ගැනීමට ගොස් සිදුකර ගත් යහපත. මෙබඳු සිදුවීම් නිසා සැදැහැවත් බෞද්ධයන් කලකිරෙනුයේ එම පුද්ගලයාට පමණක් නොව පොදුවේ භික්ෂු සංහතියටමය. මෙබඳු ඇතැම් චීවරධාරීන් නූගත් මෝඩ බෞද්ධයන් රවටමින් නොයෙකුත් ආශ්‍රමනික ක්‍රියාවන්හි නියැළී සිටින බවද රහසක් නොවේ.



# දානයේ විවිධ පැති හඳුනා ගන්න

දානය කී විට බොහෝ දෙනා සිතන්නේ, සිතීමට පුරුදුව සිටින්නේ යම්කිසි වස්තුවක් දීම ගැනය. ආර්ථික වටිනාකම් ඇති දෙයක් දීම ගැනය. එහෙත් ඊට වඩා පුළුල් අන්දමින් මේ දෙස බැලීමට පුරුදුවීම වැදගත්ය. 'දනය' යනු තමා සතු දෙය පරිත්‍යාග කිරීම යැයි අපි සිතමු. එවිට සතු දේ මොනවාදැයි ඔබට තේරුම් කරගත හැකිය. මා සතු දේ යන්න ඔබට මෙසේ සිතිය හැකිය. මගේ හිත, කය, නැතහොත් ජීවිතය, මා සතු වටිනාම දෙය වේ. අප ලොවේ සියලුම දේ කරන්නේ ජීවිතය රැකගැන්ම හා සැනසීම වෙනුවෙනි. මීළඟට අපගේ ජීවිතයේ අංගෝපාංගයන් ඔබ සතුය. ඔබේ සිරුරේ ඇති ඇස්, ඉස්, මස් ලේ ආදී අවයව හා ඉන්ද්‍රියයන්ය. එසේ මනසේ ඇති අත්දැකීම්, දැනීම්, උගත්කම්, බුද්ධිමත් භාවය, යහපත් ගුණාංග ආදී දීමට සුදුසු වටිනා දේ ඔබේ මනස සතුව ඇත.

එසේ ඔබගේ ජීවිතයේ පැවතීම ගැන ඔබට සිතා බැලිය හැකිය. මිනිසකු ලෙස උපන් අපට හැමදා ජීවත් විය නොහැක. මෙලොව ජීවත් වීමට අපට ඇත්තේ සීමිත වර්ෂ ප්‍රමාණයකි. මැරෙන තුරු ජීවත් වීම අප සතුය. එසේම ජීවිතයේ ගෙවී යන මේ කාලය ඉතා සීමිතය. අපට බොහෝ විට වටිනාකමක් ලෙස නොපෙණුනද ජීවිතයේ අගනාම දෙය මේ කාලයයි. එය උපමා කළ හැකි දෙයක් ලොවේ නොමැත.

ජීවිතයේ ඒ ඒ කටයුතු සඳහා කාලය යෙදවූ අයට කාලයේ අගනාකම හොඳින් වැටහේ. බොහෝ විට ඔවුහු තමන්ගේ කටයුතුවලට අවශ්‍ය

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"

කාලය පරිත්‍යාග කරමින්ම වෙනත් අවශ්‍ය දේවලට යති. "නිකං කාලය ගිය එක විතරයි වුණේ", "කාලය කා දමන්න එපා", අප ඇතැම් විට කියන්නේ කාලයේ මේ ඇගයීම නිසාය. අප රටේ වර්තමාන හැඩගැස්ම අනුව බොහෝ දෙනකුට කාලයේ වටිනාකම දැනෙන්නේ අඩුවෙනි. ගෙවෙන හැම මොහොතක්ම තමාගේ, අනුන්ගේ දියුණුවක් සඳහා යෙදවිය යුතු යැයි අප සිතන්නේ, එසේ සිතා හැඩ ගැසෙන්නේ නම් ජීවිත මීට වඩා කඩිසරය. දියුණුය. එවිට කාලය ජීවිතයේ වැඩට මදිවන බව අපට පෙනේ. හැකිතාක් අවශ්‍ය දේටම යෙදීමට අපට පුරුදු වෙයි. අනවශ්‍ය දෙයට කාලය කැප නොකිරීමට අප උනන්දු වෙයි. මෙසේ කාලය මුදල්වලටත් වඩා වටිනා දෙයක් බව සිතීමෙන් නොව ක්‍රියාවෙන්ම ඔබට වැටහෙන්නට පටන් ගනී. ජීවිතයේ ඉතා වටිනාම සම්පත කාලයයි. එය සීමා සහිතය. එය අප සතු වටිනාම දෙයයි. එය අප යම් කටයුත්තක් වෙනුවෙන් කරුණාවෙන්, මෛත්‍රියෙන් කැප කරන්නේ නම් වටිනා කුසලයක් නොවේද? වඩාත් හොඳින් එය පරිත්‍යාගයක් ලෙස වැටහෙන්නේ කාලයෙන් ප්‍රයෝජන ගන්නා අයටය. යම් දෙයක් කිරීමට සිතීමේදී කාලය මිඩංගු වීම ගැනද ඔවුනට අනිවාර්යයෙන්ම සිතන්නට වන නිසාය.

> "ජීවිතයේ ශ්‍රම ශක්තියද වටිනා අප සතු දෙයකි. කටයුත්තක් වෙනුවෙන් අපට යෙදවිය හැකි කායික, මානසික ශක්තිය, බලය, වේගය මින් අදහස් වෙයි. ඇතැම් විට අපගේ ශක්තිය අප පුරුදු කරගත් ශක්තියක් වීමට ඉඩ ඇත. එහි අපගේ පුහුණුව, කුසලතාව හෙවත් හැකියාවන් මීට අයත් වෙයි."

ජීවිතයේ ශ්‍රම ශක්තියද එසේම වටිනා අප සතු දෙයකි. කටයුත්තක් වෙනුවෙන් අපට යෙදවිය හැකි කායික, මානසික ශක්තිය, බලය, වේගය මින් අදහස් වෙයි. ඇතැම් විට අපගේ ශක්තිය අප පුරුදු කරගත් ශක්තියක් වීමට ඉඩ ඇත. එහි අපගේ පුහුණුව, කුසලතාව හෙවත් හැකියාවන් මීට අයත් වෙයි.

යාන්ත්‍රික දෝෂයක් නිසා වාහනයක් පාරක නතර වී ඇතැයි සිතමු. රියැදුරු තැන ඉතා වෙහෙසී එය හද ගැනීමට වෙහෙසෙයි. ඒ අසලට පුද්ගලයන් කිහිප දෙනෙක් පැමිණෙති. කෙනෙක් වඩුවෙකි. කෙනෙක් මේසන් කෙනෙකි. කෙනෙක් කම්කරුවෙකි. කෙනෙක් ලිපිකරුවෙකි. කෙනෙක් මෝටර් රථ කාර්මිකයෙකි. රියැදුරා මේ පිරිසෙන් වාහනය තල්ලු කර දෙන ලෙස ඉල්ලයි. එවිට ඒ පිරිස එක්ව වාහනය තල්ලු කරති. මෙහිදී මේ පුද්ගලයන් කළේ තමන්ගේ කායික ශක්තියක් අනෙකාගේ යහපතට යෙදවීමය. එහෙත් එය සමාජ යුතුකමක් යන හැඟීමෙන් කළා මිස පිනක් යන හැඟීමකින් කළා නොවේ.

එහිදී එම පිරිස පොදුවේ යෙදවූයේ තම තමාගේ කායික ශක්තිය පමණි. එසේ වාහනය තල්ලු කළ නමුදු රියැදුරු තැනට එය පණගන්වා ගැනීමට බැරිවෙයි. එවිට මෝටර් රථ කාර්මික විද්‍යාව හැදෑරූ පුද්ගලයක් ඉදිරිපත්ව වාහනයේ එන්ජිම පරීක්ෂා කර බලා දෝෂය තේරුම් ගනී. තේරුම් ගෙන සිරුරේ මජං තවරාගෙන මහන්සි වී එය හද දෙයි. අනතුරුව රියැදුරු තැන ස්තුති කොට පිටත්ව යයි.

මෙහිදී මෝටර් රථ කාර්මිකයා යෙදවූයේ සාමාන්‍ය ශක්තිය නොව පුහුණු ශක්තියකි. පුහුණු ශක්තියක් වන විට එහි කායික ශක්තිය මෙන්ම මානසික ශක්තියක්ද ගැබ්ව ඇත. එසේම එම ශක්තිය ලැබීම වෙනුවෙන් හා දියුණු කරගැනීම වෙනුවෙන් යෙදවූ කාලයක අගයක්ද ඇති බව ඔබට සිතා ගත හැකිය. මෙසේ තමා සතු දෙය අතර ඉතා වටිනා දෙයක් ලෙස ශ්‍රම ශක්තිය ඔබට වටහා ගැනීම පහසුය.

කෙනකුගේ දැනුම ඔහු සතු වටිනා දෙයකි. මෙහිදී බාහිර විද්‍යා ශාස්ත්‍ර දැනුම එකකි. ජීවන තක්ෂිලාවෙන් ලත් දැනුම එකකි. ආගම ධර්මය හැදෑරීමෙන්, සිතීමෙන් ලද දැනුම එකකි. මේ සියල්ලම අපට අනෙකාට දිය හැකි අප සතු වටිනා දේවල්ය. තමන් හැදෑරූ විද්‍යා ශාස්ත්‍රීය ඥානය වටිනා එකක් බව අමුතුවෙන් කිව යුතු දේ නොවේ. එම දැනුම තවත් අයකුට ලබාගැනීමට සිදුවන්නේ යම්කිසි අගනාකමක් දීමෙනි. මුදල් දීමෙනි. එහි අගය නිසාය. එහෙත්, එසේ උගත් අයකු බොහෝ විට තම දැනුම පරිත්‍යාග කරයි. ඉගැන්වීම්, ලිවීම්, සාකච්ඡා කිරීම්, දේශන පැවැත්වීම් මගින් ඇතැම් විට එම දැනුම අනෙකාට ලැබේ. මේ උගත් අය සතු දැනුම්ය. එසේ නූගත් අයටද ජීවන පරිඥානයක් ඇති බව අපද වටහා ගත යුතුය.

**ධර්ම ගවේෂක**

# චුල්ල සුතසෝම ජාතකයෙන්

## හෙළිවන අප්‍රමාදව කුසල් රැස්කිරීමේ අනුහස්



සනරාමර ලෝකශිවංකර තිලෝගුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙර වැඩ වාසය කරන සමයෙහි මහභිණික්මන් අරභයා මෙම ජාතක කථාව දේශනා කොට වදාළ සේක.

යටගිය දවස බරණැස් නම් රාජධානියෙහි සුදර්ශණ නම් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රජ කළහ. එවිට අප මහබෝසතණන් වහන්සේ ඒ බඹදත් රජතුමාගේ අග මෙහෙසිය කුස පිළිසිඳ උපන්නාහ. ඒ කුමාරයාණන් බිහි වූ කළ මුහුණ පුන්සඳ හා සමාන විය. ඒ ශ්‍රී ශෝභාවය ගැන සලකා ඒ කුමාරයාණන්ට සෝමනස්ස කුමාරයෝ යැයි නම් තැබූහ. සෝමනස්ස කුමාරයා වැඩි වියට පැමිණ ශ්‍රවණය ධනය කොට සිටි හෙයින් සුතසෝම යැයි ප්‍රකට විය. සුතසෝම කුමාරයා සොළොස් හැවිරිදි වියට පැමිණ තක්ෂිලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් ශිල්ප ඉගෙන පැමිණ පියාණන්ගෙන් රාජ්‍ය ලැබ සුතසෝම රජ වශයෙන් දස රාජධර්මයෙන් රජකම් කරමින් උන්නාහ. ඒ රජුට සොළොස් දහසක් පමණ පුරාංගනාවෝ වූහ. මෙසේ වැඩිවිය පැමිණ සරණ බන්ධනයට පිවිස දූදරුවන් ඇතිවූහ. කලක් ගතවූ තැන ගිහි ගෙයි කළකිරී මහණ වීමට කැමති වූහ. එසේ සිතා කරණවැමියා කැඳවා කිසියම් දිනෙක තමහිසෙහි සුදු හිසකෙසක් දුටුවොත් එය තමන්ට පවසන්නැයි නියම කරන ලදී. ඉන් පසු දිනෙක රජුගේ හිසෙහි සුදු කෙසක් දැක කරණවැමියා ඒ බව රජුට දැන්වූයෙන් එය ගලවා රජුට දක්වන්නැයි පැවසීය. එය රන්

අඹුවකින් ගලවා දැක්වූ කල්හි බෝසතාණන් වහන්සේ මාගේ ශරීරය ජරාවෙන් මඩනා ලද්දේ යැයි කියා නර කෙස අතින් ගෙන ප්‍රාසාදයෙන් බැස මහජනයාට පෙනෙන ස්ථානයක ආසනයක් පනවා එහි හිඳ සෙනවිරත් ප්‍රධාන කොට ඇති අමාත්‍යවරුන්, පුරෝහිත බමුණන්, නගර වාසීන් රැස් කරවා මගේ හිසෙහි නර කෙසක් පහළ වී ඇත. මහණ වීමට කාලය පැමිණ ඇතැයි දන්වන ලදි.


ඒ බස් ඇසූ එතනට රැස් වූ සැම දෙනා විශ්මයට පත්ව දේවයන් වහන්ස, කුමක් නිසා මෙබඳු බස් කියන්නෙහි ද? නුඹ වහන්සේගේ සැට දහසක් පමණ පූරාංගනාවෝ නුඹ වහන්සේ මහණ වූ විට අනාථව අසරණ වන්නාහ. ඒ හැම අනාථ කොට මහණ වීම සුදුසු නොවේ. එවිට බොධිසත්වයන් වහන්සේ ඒ හැම දෙනා ළදරු නොවන්නාහ. ඒ හැමදෙනාටම ස්වර්ග මාර්ගය ප්‍රාර්ථනා කොට මම මහණ වෙමියි කීහ. එවිට රජුගේ බසට ප්‍රති උත්තර දීමට නොහැකිව සියලු අමාත්‍යයෝ මවු බිසවුන් කරා ගොස් මේ බව දැන්වූහ. එවිට ඇය ද වහා නැගිට රජ්ජුරුවන් සමීපයට ගොස් එම්බා පුත්‍රය, අප අඬමින් සිටියදී අප ගැන දුකක් නොමැතිව ඔබට මව්ව සිටි අප සැම දුකින් තබා මහණ වන්නේ වේ දැයි විමසූහ. එවිට බෝධිසත්වයෝ මෙසේ අඬන්නා වූ මෑණියන් සමග කිසිවක් නොකීහ. එකල අමාත්‍යයෝ පියරජ්ජුරුවන්ට ඒ බව ගොස් දැන්වූහ. එවිට පිය රජ්ජුරුවෝද සුතසෝම රජ්ජුරුවනි. තෙපි අපට පුත්‍රව අපි වයසට පැමිණි කල අපේ අපේක්ෂාවන් ඉටු නොකොට මහණ වන්නේ කුමන ගුණයක් නිසාදැයි විමසීය. ඊට ද මුවෙන් නොබැන උන්හ. නැවත පිය රජ්ජුරුවෝ තොප දෙමාපියන් කෙරෙහි ස්නේහ නැත්නම් තොපගේ බාල බොහෝ දරුවෝ කෙරෙහි ස්නේහයෙන් ඔවුන් වැඩිවිය පැමිණෙනතුරු තපසට නොගොස් සිටින්නැයි කියා සිටියේය.

එවිට බෝසතාණන් පියරජතුමනි, මම දූදරුවන් කෙරෙන් පමණක් වෙන් වන්නේ නොවෙමි. නුඹවහන්සේ ඇතුළු සියලු සත්ත්වයන් කෙරෙන්ද සංස්කාර ධර්මයන්ට අනුව සියල්ලෙන් ද වෙන්වීමට නියමිතය. පියරජු බෝසතාණන්ගේ ධර්මය අසා කිසිවක් කියාගත නොහැකිව උන්හ. අනතුරුව බෝධිසත්වයන් සමීපයට ආ අන්තඃපුර ස්ත්‍රීන් ද ගොප්මස අල්වා අඬන්නට වූහ. දේවයන් වහන්ස, ඔබවහනසේගේ ළය තදව ගියේ ද යැයි අසමින් අපි වැන්දඹු කොට මහණ වීමට යන්ට ඔබතුමාගේ ළය කරුණාමාත්‍රයක්වත් නොඋපදින්නේ ද? එය ඇසූ බෝසතාණන් වහන්ස්, තොප හැම දෙනා කෙරේ කරුණාවෙන් ස්වර්ගය ප්‍රාර්ථනා කොට පැවිදි වෙමි. බුද්ධාදී උතුමන් විසින් පැවිද්ද වර්ණනා කරන ලදි. එබැවින් ඔබලා අතුළු සියලු සත්වයන් සංසාර කාන්තාරයෙන් එතෙර කිරීමට මහණදම් පුරන හෙයින් ශෝක නොකරන්න. එවිට අග මෙහෙසිය මේ පුවත දැනගෙන පැමිණ බැගෑපත්ව අඬමින් නුඹ වහන්සේ නිසා දරුගැබ ඇති මා කෙරෙහි කිසි අපේක්ෂාවක් නැතිව දරුගැබ කුසෙහි මුහුකුරා යන්නත් පෙර මා හැර යන්නේ ඇයි ද? දරුගැබ මුහුකුරා ගොස් වදන තෙක්වත් සිටින්නැයි ඉල්ලා සිටියාය. බිසව ශ්‍රී යහන්ගබඩාවට පිවිස එහි තබා අඬන්නට වන්නාහ. එකල බිසවුන් අස්වසන්නා වූ බෝධිසත්වයෝ, එම්බල භද්‍රාව ශෝක නොකොට ප්‍රාසාදයට නැගී යන්න. තොප කෙරෙහි හෝ අන් කිසි සත්ත්ව කෙනෙක් කෙරෙහි හෝ අපේක්ෂාවක් නැතිව මම මහණ වෙමියි කීහ. බිසව බෝධිසත්වයන් කී බස අසා සිටීමට නොහැකිව මතු මහළට නැගී අඬමන් වැළපෙමින් උන්නාය.

අනතුරුව බොධිසත්වයන්ගේ වැඩිමහල් පුතු අඬමින් සිටි මෑණියන් සමීපයට පැමිණ මවගේ හැඬීමට කාරණා විමසා සිටියේය. එවිට කුමාරයා තමන් ලඟට කැඳවා තමන් මහණ වන බව දැන්වූ කල මළනුවන් වූ සෝමදත්ත කුමාරයා ද මහණ වනු කැමතිව පැමිණීමට අවසර පැතුයෙන් එවිට ඔබ සමග එක්ව වාසය කළ නොහැක. ඔබත් මහණවෙමියි කී කළ ජනපද වල සත්ත්වයෝද එහි ගිනිගන්නා හ. අප දෙදෙනාම මහණවූ කළ සියළු රාජ්‍ය වාසීහු අනාථව අසරණ වන්නාහ. ඒ කාරණය හේතුකොට ගෙන තෙපිට මහණවිය නොහැක. මම මහණ වෙමියි කීහ. එවිට මහජනයා සුතසෝම රජ්ජුරුවන් මහණ වූ කල අපි කුමක් කරමුදැයි මහ හඬින් හැඬූහ. එකල බෝසතාණෝ තොප හැම නොහඬව. ශෝක නොකරව. මම තොප සමග නොබෝ කලක් වාසය කළත් යම් දවසක තොප හැමගෙන් වෙන්වෙමි. උපන්නා වූ යම් සංස්කාර ධර්මයක් නිත්‍ය දෙයක් නොවේ යැයි ධර්ම දේශනා කොට දරුවනි, ස්වල්ප වූ සංස්කාර අරගෙන ඇවිදිනා සත්ත්වයන් විසින් කුසල් කිරීම ප්‍රමාද වන්න නොවටිනේය. අප්‍රමාදව කුසල් කරන්නට වටිනේය. අඥාන වූ සත්ත්වයෝ ජරා මරණ නැත්තවුන් මෙන් කාමසූකරයන් මෙන් කුසල් කිරීමේ ප්‍රමාදව නරක තිරිසන් අපාය, ප්‍රේත කාය, කාලකඤ්ජ නම් අසුර නිකාය යන අපාය වල ගිනි දැල් වර්ධනය කරන්නෝය යනුවෙන් දේශනා කොට චූෂ්පක නම් ප්‍රාසාදයට නැගී සත්වෙනි මාලයේ සිට මඟුල් කඩුව ගෙන කෙස්වැටිය කපා අතින් ගෙන මහජනයාට කියන්නාහු මම තොප හැමට ඇවසි නැත්තෙමි, එසේ හෙයින් තොපගේ රාජ්‍ය තොපම පිළිග නුවයි කියා හිස් වෙලුම සහිත වූ කෙස් වැටිය කපා අතින් ගෙන මහජනයා මැද්දට දැමූහ. මහජනයා දැමූ කෙස්වැටිය අතින් ගෙන බිම ඇත මැත පෙරළෙමින් මහ හඬින් හඬන්නට වූහ. ඒ ස්ථානයේ බොහෝ සෙයින් දූවිලි නැගෙන්නට වූහ.

එවිට දුරින් සිටියාවූ සත්ත්වයෝ දැක රජ්ජුරුවන් වහන්සේ කෙස් වැටිය කැපූ සේක්වනැයි කියා මහ හඬින් හැඬූහ. එකල මහ බෝසතාණෝ පරිවාර ජනයා යවා සල්පිලෙන් තවුස් පිරිකර ගෙන්වා ගෙන කරණවෑමියා ලවා දැලි රැවුලු කෙස් කපවාගෙන රාජාභරණ ගලවා දමා වීදි මධ්‍යයෙන් නික්මුනාහ. නික්මුණු රජතුමා කිසිම කෙනෙක් හැඳින නොගත්හ. එවිට රාජකන්‍යාවෝ

28 වැනි පිටුවට ▶



ප්‍රාසාදයට නැඟී රජ්ජුරුවන් නොදැක ප්‍රාසාදයෙන් බිමට පැමිණ දොළොස්දහසක් පමණ පුරාංගනාවන් සමීපයට ගොස් තොපගේ වල්ලභයානෝ මහණව ගියෝ වේදැයි මහ හඬින් අඬමින් ප්‍රාසාදයෙන් නික්මුනාහ. එකල නුවර වාසීහු ද රජ්ජුරුවන් මහණ වූ නියාව දැක සියලු නුවර එක පැහර ඇලලී ගියේය. රජ්ජුරුවන් මහණව ගිය සේකැයි දොරකඩ රැස්ව, රජ්ජුරුවන් මෙතනදෝයි කියා නිතර වසන්නා වූ ස්ථාන පරීක්ෂා කොට හඬා ඇවිදිනා වූ රජ්ජුරුවන්ගේ ප්‍රාසාදය රන් මලින් ද සුවඳ දියෙන් ද සරහා සොළොස් දහසක් පමණ පුරාංගනාවන් පිරිවරන ලදුව කෙළ ඇවිද්දා වූ ස්ථානය දැක හඬන්නාහ. එසේ තැන තැන ඒ ඒ වනයන් ද පරීක්ෂා කොට හඬා වැලප මහබෝසතාණන් වසන්නා වූ ස්ථානයට පැමිණියහ. සියළු අන්තඃපුර, පිටිපුර, ගම් නියම්ගම් හිස්ව ගියාක් මෙන් විය.

එකල බෝධිසත්වයෝ කෙමෙන් හිමාල වනය අභිමුවට නික්මුනාහ. බෝසතාණෝ අභිනික්මන් කළ බව දැන සක්‍ර  දේවේන්ද්‍රයා විශ්වකර්ම දිව්‍යපුත්‍රයා තම සමීපයට කැඳවා එම්බා දිව්‍යපුත්‍රය, සුතසෝම රජු මහභිනික්මන් නික්මුනාහ. උන්වහන්සේ වසන්නා වූ ස්ථානයක් ලබන්ට වටනේය. එසේ හෙයින් තෙපි ගොස් හිමාල වන ප්‍රදේශයේහි ගංතෙර තිස් යොදුන් පමණ පළල ඇති ආශ්‍රම ප්‍රදේශයන් මවා එවයි යැවූහ. විශ්ව කර්මයා ද කීවා වූ ස්ථානයේහි ආශ්‍රම ප්‍රදේශයක්ද තවුස් පිරිකර ද පිළියෙල කොට එක් පියවර සටහන් ඇති මාර්ගයක් ද මවා දිව්‍ය ලෝකයටම ගියේය. බෝධිසත්වයෝ එක් පියවර සටහන් මාර්ගයේ ගොස් ආශ්‍රමයට වැද පළමුව තමන් මහණව පසුව අවශේෂයන් මහණ කරවූහ. මෙසේ කල්යාමෙන් බොහෝ දෙනා මහණ වීමෙන් තිස් යොදුන් පමණ ආශ්‍රමයද පිරුණේය. මෙසේ බෝසතාණෝ කාම විතර්කයත්, ව්‍යාපාද විතර්කයත් උපන්නේ වී නම් ඒ ස්ථානයට ආකාසයෙන් ගොස් මෙසේ ධර්ම දේශනා කරන්නාහ. එම්බා තාපසයනි, පලමු තොපගේ රති ක්‍රීඩාදී කෙළියක් සිනාවක් ඇත්නම් එය සිහි නොකරව. පංච කාමයෙන් නොමිරිකෙව. සුදර්ශන නම් නුවර ඉතා සිත්කලුය. එසේ හෙයින් එය සිහි නොකරව. රෑ දහවල් අප්‍රමාදව මෙත් සිත් ඇති කරව. එසේ භාවනා කොට කුසල් කළා වූ සත්ත්වයන්ට වාසස්ථාන වූ බ්‍රහ්ම ලෝකයට යවයි යනාදියෙන් අවවාද කරන්නා හ. ඒ තපස්හු ද මහබෝසතාණන්ගේ අවවාදයෙහි පිහිටා බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහ. බෝධිසත්වයන් ද නොපිරිහුණු ධ්‍යානයෙන් පර්ශත් හා සමග බ්‍රහ්ම ලෝකයෙහි උපන්නායැයි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාළ සේක. මහණෙනි දැන් මතු නොවෙයි පළමුවත් මහභිනික්මන් කළේ යැයි වදාරා පූර්වාපර සන්ධි ගලපා මෙම චුල්ල සුතසෝම ජාතකය නිමවා වදාළ සේක. එකල දෙමාපියෝ නම් සුද්ධෝදන රජු හා මහ මායා දේවියයි. අග මෙහෙසින් වූ චන්ද්‍ර දේවී යශෝදරාවන්ය. වැඩිමහලු පුතණුවෝ නම් දැන් රාහුල කුමරුවෝය. එදවස කිරි මවු නම් ඛුජ්ජුත්තරාවෝ ය. එදවස කුළවර්ධන කපුවා නම් මහ මොග්ගල්ලාන ස්ථවිරයෝය. එදවස අභිනික්මන් කළා වූ සුතසෝම රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය. අභිනික්මනෙහි අනුහස් ගැන කියවෙන මෙම ජාතක කථාව කියවන අපද සියල්ල අතහැරීමේ වැදගත් කම දැන අප්‍රමාදව කුසල් රැස්කර ගැනීමට අද අදම උත්සුක වීමට හිතා ගනිමු.


**කේ. මීගහකුඹුර**

# සදහම් ප්‍රහේලිකා අංක - 93

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය අප්‍රේල් මස 8 වැනිදා බව සලකන්න
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.



### ▶ හරහට

1. විනයධාරීන්ගේ අගතැන්පත් තෙරණිය.
3. ත්‍රිවිධරත්නයට අයත්ය.
5. කඨින චීවර පොහොය.
6. 'නොමේරූ' යන අරුත ගන්වයි.
10. මොහු අපල ගෙන දෙන ග්‍රහයෙක් ලෙසට සැලකේ.
11. සිදුහත් කුමරුට නම් තැබූ බමුණන් 8 දෙනාගෙන් කෙනෙකි.
14. මෙය අසාර වූ දෙයක් ලෙසට බුදු දහමේ ඉගැන්වේ.

### ▼ පහළට

2. සිදුහත් කුමරුගේ පුත්‍රයා.
3. ඉන්දියාවේ එද පැවැති ප්‍රසිද්ධ ජනපදයකි.
5. මේවා ශරීරගතවීමෙන් මරණය පවා සිදුවේ.
7. මෙම වචන කීමෙන්ද පව් සිදුවේ.
8. මහියංගණ චෛත්‍යය තැන්පත් කොට ඇති බුදුන්ගේ ධාතු.
9. පස්මහ බැලුම්වලට අයත්ය.
12. බුදු පුදයට ගෙන යති.
13. සිදුහත් කුමරුන්ට සැදූ මාලිගාවකි.
14. පැරණි අය වළං ගෙනයාමට භාවිත කරති.

**ප්‍රහේලිකා අංක 92 ජයග්‍රාහී වාසනාවන්තයන්ගේ නම් ලබන කලාපයේ පළවේ**

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර එකොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක<br>
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය<br>
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න

www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

# පීඩනයක් හිතට ආපසු දරා ගන්නේ කොහොමද

# අද කාලේ ප්‍රශ්නවලට විසඳුම් බණ පදවල නැද්ද

# මිනිසුන්ට ජීවිතය ගැන කියා දිය යුතු පළමු පාඩම කුමක්ද

## දෙල්දූවේ ඥාණසුමන හිමියන්ගෙන් පිළිතුරු

❐ මිනිසුන්ට ජීවිතය ගැන කියා දිය යුතු පළමු පාඩම කුමක්ද ?

පළමුව මනුෂ්‍ය ජීවිතය තරම් උතුම් දෙයක් මෙලොව නෑ කියන එක හිතන්න. මේක අද හිතන පිරිස අඩුයි. පුංචි ප්‍රශ්නයකදී වහ බොන්නේ, කෝච්චියට බෙල්ල තියන්නේ ජීවිතයට තියෙන වටිනාකම ගැන නිවැරදි තක්සේරුවක් නොමැතිකම නිසයි. අනිත් ආගම්වලින් බෞද්ධ දර්ශනය වෙනස් වෙන්නෙත්, ජීවිතයට දීලා තියෙන මේ වටිනාකම අනුවයි. නමුත් අපි ඒක හරියට කියලා දීලා තියෙනවාද? එහෙම නම් මේ රට ලෝකයේ වැඩියෙන්ම සියදිවි නසාගන්නා මිනිසුන් ඉන්න රට හැටියට එකතු වෙන්නේ නෑ. විශේෂයෙන්ම පන්සල තුළ මේ සඳහා යම් වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතුයි. ඔය ඇත්තොම හිතන්න අපිට ඒ දර්ශනය අඩුම ගාණේ පන්සලෙන්වත් දීලා තියෙනවාද? ජීවිතය ජරාවක්, මරණයක්, අවීචි මහා නරකාදියක් කියන දේ කතා පොත්වල පිටු පෙරල පෙරලා කියවනවා මිසක් ජීවිතයේ උතුම් බව කවුද කියලා දීලා තිබුණේ? මොන ප්‍රශ්නය ආවත් ඇතුළාන්තය පිරිසිදු කරගන්න හැටි කියලා දීලා තියෙනවාද? මේ හින්දා නේද ජීවිතවල වටිනාකම සමාජයට කියා දිය යුත්තේ.

❐ පීඩනයක් සිතට ආ පසු දරාගන්නේ කොහොමද?

මොන පීඩනයක් ආවත් එය තමන්ගේ කරගන්න එපා. මනස ඇතුළට අරගන්න එපා. මම උදාහරණයක් කියන්නම්. තමන්ට කාගෙන් හරි අනවශ්‍ය විදිහට හිරිහැර කිරීමක් සිදුවෙනවා. ඉතින් මේක ඔළුවේ තියාගෙන හිටියොත් මොකද වෙන්නේ? කවදාවත් ඒක ඔළුවේ රැඳිලා තියෙන තුරු විසඳුමක් ලැබෙන්නේ නෑ. එහෙම වුණත් අපි හුරුපුරුදු වෙලා ඉන්නේ ප්‍රශ්නය ඇතුළේ තියාගෙන විඳවමින් පිළිතුරු සොයන්නයි. මේ හේතුව හින්දා අපි නොසිතන පැත්තක් ඇවිල්ලා තියෙනවා. ඔය ඇත්තෝ මතක තියාගන්න, මනස කඩා වැටුණු පිරිස වැඩියෙන් රෝගාබාධවලට ලක්වෙලා තියෙනවා. ඒක නිසා ප්‍රශ්නයක් පිටින් තියලා බලන්න පුරුදු වෙන්න. කලබලයක් නොවී ප්‍රශ්න විසඳා ගන්න. ඔය ඇත්තෝ කරන්නේ ප්‍රශ්න දකිනකොට කලබල වෙනවා. ඊට පස්සේ නූල් බෝලයක වගේ ප්‍රශ්න දෙස බලා විසඳුම්


''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''

සොයාගන්න. අනිත් දේ තමයි හැමවිටම බලන්න ප්‍රශ්න අඩුකර ගන්න. අපි බලන්නේ ප්‍රශ්න වැඩිකර ගන්නනේ. ප්‍රශ්නයක් නැත්නම් අහකින් යන දෙයක් හරි දාගෙන දුක් විඳිනවා. ප්‍රශ්න අවුල් වියවුල් කරගන්න එපා. අවුල් ජාලාවක් වූ ප්‍රශ්නවලට පිළිතුරු සොයාගන්නත් හිතන තරම් පහසු නෑ. මේක අවබෝධ කරගත්තොත් ජීවිතය ගෙනියන්න ගොඩාක් පහසු වේවි.

❐ අද කාලේ ප්‍රශ්නවලට විසඳුම් බණ පදවල නැද්ද?

බණ නෙමෙයි අද රටට අවශ්‍ය දැනුවත් කිරීමක්. පවතින තත්ත්වය තේරුම් කර දීමක්. තවත් දෙයක් තමයි අපි ප්‍රශ්න විග්‍රහ කරන හැටි හරිම පටුයි. එදා ප්‍රශ්නයක් දැක්ක හැටියට අද දකින්නත් බෑ. විසඳුම් සොයන්නත් බෑ. මොකද මේ හැම ප්‍රශ්නයකම මුල තියෙන්නේ ආර්ථික, සමාජ, දේශපාලන කියන රාමුව ඇතුළේ. වෙනදාට වඩා ජාත්‍යන්තර පරාසයක් අපේ සමාජය තුළට ඇවිත් තියෙනවා. ධර්ම දේශනාවක් කරන කොට මේ හැම දෙයක්ම අවබෝධ කරගත යුතුයි. මෑතක් වනතුරුම ධර්ම දේශනාවල ඇසුණේ තොරන්වල යන කතා ටිකම විතරයි. වයසක උදවිය විතරයි මේ කතා අහලා සාධුකාර දුන්නේ. මේ තත්ත්වය වෙනස් කිරීම ආරම්භ කළේ සෝම හාමුදුරුවෝ. උන්වහන්සේ හොඳ සමාජ කතිකාවතක් ආරම්භ කළා. අද අවශ්‍ය මේ කතිකාවතට පැහැදිලි දර්ශනයක් සැපයීම. මොකද තරුණ තරුණියෝ අද පන්සලට එනවා. බෞද්ධ පොත පත වැඩියෙන් විකිණෙනවා. ධර්ම දේශනාවක් කළත් ගැටලු ගැන ප්‍රශ්න කරනවා. තමන්ගේ ගැටලු නිරාකරණය කරගැනීමට පන්සලට එන පිරිස වැඩියි.

❐ සමාජයේ ගැටලු දෙස අලුත් ඇසකින් බලන්න කියන්නේ ඇයි?



"ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි."



පැරණි සමාජයේ ආකල්ප වෙනස් වීගෙන යනවා. දවසින් දවස පැරණි ආකල්ප ගරා වැටෙනවා. මේ පොදු ස්වභාවය අපි අවබෝධ කරගත යුතුයි. මේ ගරාවැටීම්වලට අපි අඬෝනා නගලා වැඩක් නෑ. සමාජය පිරිහිලා. අම්මා, තාත්තා තකන්නේ නෑ. මේවා කියලා වැඩක් වෙන්නේ නෑ. සමාජයට යම් උපදේශයක් අවශ්‍යයි. එතැන තමයි දූන් හිස් තැන තියෙන්නේ. මේ උපදේශනය යුගයට ගැළපිය යුතුයි.

❐ තරුණ පරපුරට තීරණයක් ගන්න බෑ කියන හැඟීම බොහෝ දෙනෙක් තුළ තියෙනවා. මෙය ඔබවහන්සේ දකින්නේ කොහොමද?

නූතන සමාජය නිසි මඟ පෙන්වීමක් නැතිව බැණ වැදීම වැඩක් නෑ. තරුණ පරපුරට දේශපාලනඥයන්, ආගමික නායකයන්, වැඩිහිටියන් නිසා මාර්ගය පෙන්වා දෙනවාද? අද කියනවා අලුත් පරපුර ප්‍රචණ්ඩත්වය ගිලගෙනලු. ළමයි ප්‍රචණ්ඩ කළේ කවුද? අපේ රජයේ දේශපාලනඥයන් නොවේද? යන තැන ඉඳන් කියන්නේ මුසාමයි. වැඩිහිටියන්ගේ වැරදි ආදර්ශය තමයි දරුවෝ ගන්නේ. පන්සල තුළින් පවා තරුණයන්ව කැඳවන්නේ දාන, ශීල, භාවනා වැඩසටහන්වලට. මේවාටත් තරුණයෝ එනවා, තරුණියන් එනවා. නමුත් ප්‍රශ්නය මොනතරම් සුළු ප්‍රමාණයක්ද වැඩිපුරම මේවට එන්නේ? රැකියාවක් කරන ආර්ථික ප්‍රශ්න විසඳුන තරුණ පිරිස පමණයි. ග්‍රාමීය තරුණ පිරිස මේවාට එන්නේ නෑ. හැම වෙලාවේම මේ තරුණ පිරිස තමයි පීඩනයෙන් පෙළෙන්නේ. පන්සල් ගියාට, දෙවියෝ ඇදහුවාට අපිට සුගතියක් වුණාද කියලා අහන්නේ මෙන්න මේ පිරිසයි. හැමදාමත් තුවක්කු අතට ගන්නේ මේ පිරිසයි. සුවිසල් මැදුරුවල දරුවෝ තමන්ගේ ආරක්ෂාවට සාක්කුවට තුවක්කු දා ගනිද්දී සමාජ ක්‍රමය පෙරළන්න මේ තරුණයෝ අවි ආයුධ අතට ගත්තා. නිරායුධ තරුණයෝ එහෙම කළේ දූවෙන මානසික පීඩනය තුළින්. මේ පීඩනය කපා දමන්න තමයි භික්ෂූන් වහන්සේනමක් හැටියට මා නම් කටයුතු කරන්නේ. මේ වෙනකොට පැරණි සමාජ ආකල්ප දරුණු ලෙස කඩා වැටෙනවා කියන එක කවුරුත් අවබෝධ කරගත යුතුයි. ඒ ගරා වැටෙන තැන නූතන ආකල්ප ගොඩනැගී නැත්නම් මේ සමාජය වල්මත් වෙනවා. දූන් වෙමින් පවතින්නේ එයයි. අනික් දේ තමයි තීරණ ගැනීමේදී අද තරුණ පරපුර ඉන්නේ ගොඩාක් පසුපසින්. ඒකට වැඩිහිටියෝ වගකියන්න ඕනේ. හුඟාක් අවස්ථාවල වැඩිහිටියෝ තරුණයන්ගේ තීරණ ගැනීමේ අයිතිය උදුරාගෙන තියෙනවා. අවංකවම මේක වැඩිහිටියෝ පිළිගත යුතුයි.

**ධර්ම ගවේෂී**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# අපේ පුරාණ වෙහෙර විහාරවල යටගියාව

මහින්දාගමනයත් සමග ලක්දිව සංඝ ශාසනය ආරම්භ වීමෙන් සංඝාරාම ඉදිවිය. දෙවන පෑතිස් රජුගෙන් භික්ෂූන්ට ආරාම කැපදැයි විමසා කැප යයි කී විට මහමෙවුනා උයන මහා සංඝයාට සාංඝික කර පිදූ වග මහා වංශයෙහි මෙසේ සඳහන් වෙයි.

**"සාදුනි වත්වා ගණ්හිතවා - රාජා හිංකාර මුත්තමං**
**මහා මේඝ වනුයානං - දම්ම සංඝසි මා ඉති"**

අනුරාධපුර මුල් පිහිටු වූ සංඝාරාම කොටස් දෙකකි. එනම් උද්‍යාන සංඝාරාම හා ගිරි සංඝාරාම යනුයි. මේ සංඝාරාම දෙවර්ගයේම ආරම්භය සමකාලීනය. උද්‍යාන සංඝාරාම ගම් නියම්ගම්වලට සමීපව පිහිටු වූ අතර ගිරි සංඝාරාම කඳු මුදුන්වල හෝ ගිරි පර්වත මුදුනත හෝ පිහිටුවිය. මෙහිදී අභයගිරිය මහා විහාරය, ජේතවනය ආදිය උද්‍යාන සංඝාරාම ලෙස ගිනිය හැකිය. මිහින්තලය, රිටිගල, නදියගිරි සංඝාරාම ලෙස දැක්විය හැකිය. ථූපවංශය, මහා වංශය, දීපවංශය ආදී වංශ කතාවලට අනුව මෙම ආරාමකරණයේ මුල් සැලසුම් සපයන ලද්දේ මිහිඳු හිමියන් විසින් බව සඳහන් වේ. ඉන්දියාව වැනි රටවල සංඝාරාම නිර්මාණ සැලසුම් මේ සඳහා උදව් කරගන්නට ඇතැයිද සිතිය හැකිය. ඇතැම් උගතුන් සඳහන් කරන පරිදි මෙම සංඝාරාම සැලසුම් නිර්මාණකරණය ඉන්දියාවේ වාස්තු විද්‍යාත්මක රටාවන් හා මෙරට දේශ අදහස් හා රටාවන්ද උපයෝගී කරගෙන නිර්මාණය කළ බවයි. මෙහිදී මෙරට දේශගුණික හා සමාජීය අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් වන්නට ඇතැයිද සිතිය හැකිය.

ලංකාවේ මුල්ම සංඝාරාමය පිළිබඳ තොරතුරු රැසක් මහා වංශයේ සඳහන් වෙයි. ඒ අනුව දෙවන පෑතිස් රජු මිහිඳු මාහිමියන්ගේ උපදෙස් මත තදම්බ නදියෙන් පටන් ගෙන නැවතත් තදම්බ නදියෙන් නිම වන පරිදි භූමි භාගයක් වෙන් කිරීම හා එකී සීමාව ඇතුළත මාලක තිස් දෙකක්ද, ථූපාරාමය සඳහා බිම් පෙදෙසක්ද වෙන් කිරීම ආගමික චාරිත්‍ර අනුව ඇතුළත සීමාවක් පිහිටුවීමද සවිස්තරාත්මකව දක්වයි.

සංචිතයෙහි පැරණි සංඝාරාමයද තක්ෂිලාවේ ධර්මාරාජික සංඝාරාමද මූලික සැලසුම් අතින් මහා විහාරයේ සැලැස්මට බෙහෙවින් සමානය. උද්‍යාන සංඝාරාම ගම් නියම්ගම්වල හා නගරබදව ඉදිවීම නිසා අභිනව අංග එකතු වූ අතර ගිරි සංඝාරාම ආගමික විශ්වාසයන්ට මුල් තැන දෙමින් ඉදිවිය.



අනුරාධපුර යුගයේ අග භාගයේ තනා ඇති පධානගර නම් සංඝාරාම පියන්ගල පිරිවෙන් නමින් හඳුන්වා ඇත. පාංශකූලික හා ආරඤ්ඤවාසී භික්ෂූන් උදෙසා එය තැනූ බව කපුරාගමුවේ වනරතන හිමියන්ගේ 'අනුරපුර නටබුන්' නමැති පොතේ සඳහන් කර ඇත. මෙම වර්ගයට අයත් සංඝාරාම සඳහා භූමි තෝරාගෙන ඇත්තේ වනවාසී භික්ෂූන්ට ගැළපෙන ආකාරයටය. මුල් කාලයේ සංඝාරාම ලෙස හඳුන්වා ඇති අතර, එම ලෙන් පර්වත ඇසුරු කොට පැවැති බව පෙනේ.

දෙවන පැතිස් රජතුමාද මිහිඳු හිමියන් ඇතුළු සැම දෙනමකටම වස් විසීම සඳහා මිහින්තලාවෙහි ගල්ලෙන් පවිත්‍ර කොට ආවාස ලෙස සකස් කර දුන් බව මහා වංශයේ සඳහන් වන්නේ මෙසේය.

''නිටඨිතෙ ලෙණ කම්මමසි - අසාලයි පුණ මාසියං
ගනත්වා ආදා සි තෙරානං - රාජා විහාර දක්යිජාං''

දෙවන පැතිස් රජතුමා විසින් අරඹන ලද මෙම ලෙන් පූජාව ක්‍රිස්තු වර්ෂයෙන් පසුවද පැවැති බව සෙල්ලිපිවලින් පෙනේ. භික්ෂූන් ආවාස හැටියට බහුල ලෙස ගල්ලෙන් ප්‍රයෝජනයට ගත් බවත්, රාජ මහා මාත්‍යයන් මෙන්ම සාමාන්‍ය ජනයාද මේවා භික්ෂූන් සඳහා කැප කර පිදූ බවත්, රටපුරා විසිරී තිබෙන ගල්ලෙන් පියන්වල කොටා ඇති ලිපිවලින් පැහැදිලි වේ. මේ හැරුණ විට කොළ අතු සෙවිලි කළ කුටි පන්සල් හැටියට පාවිච්චියට ගන්නට ඇතැයි යන විශ්වාසයද අප අතර පවතී. ඒ වගේම කොළ අතුවලින් සකසන ලද මෙම කුටි කල් ගතවීමෙන් පවා භික්ෂු ආශ්‍රමවලට මේ නමම භාවිත කළ බවත් පෙනේ. ලංකාවේ බෞද්ධ ආශ්‍රමයන්හී අද දක්නට ලැබෙන අලුත් ගොඩනැගිලිද පන්සල් නමින් භාවිත වේ. මෙය පණ්ණශාලා යන වචනයෙන් සිංහලට බිඳ ගත් වචනයකි. නව වැනි ශත වර්ෂයේ සෙල් ලිපියක පන් - හල යන වචනයද දක්වේ.


පන්සල යනුවෙන් හඳුන්වන්නට යෙදුණ විහාරයක හෙවත් ආශ්‍රමයක චෛත්‍යය, ධර්ම ශාලාව, ලැගුම් ගෙය යන අංග වෙන්කර තිබේ. නමුත් සම්පූර්ණ ආරාමයක දොරටුවෙහි දොරටු පැන් තැටිය නම් ගොඩනැගිල්ලක් තිබුණේය. මෙය පැන් කල තබා තිබුණු ස්ථානයි. මෙය වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහාත්, භික්ෂූන්ගේ පහසුව සඳහාත් තබන්නට ඇත.


පන්සලක චෛත්‍යය හැරුණු විට බෝධියද ප්‍රධාන තැනක් ගනී. මේ බෝධීන් වහන්සේ වෙනුවෙන් බෝ කොටුවක්ද ඉදිකර ඇත. මේ බෝ කොටුවේ තැනක බුදු පිළිමද ඇත. මෙවැනි බෝධිඝනඑල බුදු පිළිම තැන්පත් කිරීම ක්‍රි.පූ. පළමු සියවසෙන් පසුව සිදුවන්නට ඇතැයි විශ්වාස කෙරේ. පසු කාලයකදී ඇතැම් ආරාමවල ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම පිණිස දා ගෙයක් (ධාතු ශාලාවක්) ඇති කර තිබුණ බව මහා වංශය සඳහන් කරයි. මේ අනුව අනුරාධපුර දළදා ගෙය අතිශයින් ශෝභා සම්පන්න පූජා මන්දිරයක් විය. ආරාමයකට සම්බන්ධ කොටු මෙම මන්දිරය රාජ මන්දිරය අසලම කරවන ලද අතර, හත්වන ශත වර්ෂයේදී පමණ ආරම්භ වූ බව හියුං සාං සඳහන් කරයි.

මේ හැරෙන්නට විශාල ආරාම සමහරෙක රත්න ප්‍රාසාද නම් ගොඩනැගිල්ලක්ද ඉදිකර ඇත. මේ බව අභයගිරි, ජේතවනය, මහා විහාරය යන ප්‍රධාන ආරාම තුනෙහිම තිබූ බව මහා වංශයේ හා සෙල්ලිපිවල සඳහන් වේ. ඒ වගේම භික්ෂූන්ද දන් පිළිගැන්වීම සඳහා බත් හලක්ද විය. දෙවන පැතිස් රජතුමා විසින් කරවන ලද මහා පාලි දාන ශාලාව නිකායෙන් වෙන්වීමෙන් පසුවද අනුරාධපුර ප්‍රධාන ආරාමවල සියලු භික්ෂූන් සඳහා පොදු බත් හලක් ලෙස විවෘතව තිබුණු බව නොයෙක් ග්‍රන්ථයන්හි සඳහන් වෙයි. මෙකී විවිධ ආරාමවලට අධිපති මහා ස්ථවිර නමින් ථෙර නමක් සිටි බව අංගුත්තර නිකායට්ඨ කතාවෙහි සඳහන් වෙයි. විහාර ගම් නොතිබුණු ආදි කාලයේදී නම් ආරාමයක් පාලනය කිරීම සුළු කටයුත්තක් විය.

පාලකයා විසින් කළ යුතුව තිබුණේ නේවාසිකයන් කෙරෙහි විනය පවත්වා ගැනීමත්, ස්ථානය පිරිසිදුව ආරක්ෂා කරගැනීමත් පමණි. එහෙත් කාලයාගේ ඇවෑමෙන් මහා සංඝයාගේ වැඩිවීමත්, පන්සල්වලට දෙන ලද ගම්වර ආදිය සඟසතු කොට පිරිනැමීමත් ආදී කරුණු නිසා එහි පාලන කටයුතුවල වෙනසක් ඇතිවිය.

මේ සඳහා අධිකාරයන් විසින්ම කළ යුතු තරමට මේ කටයුත්ත භාරදූර කාර්යයක් බවටම පත්විය. පුරාණ ලංකාවේ මෙහි පාලන තන්ත්‍රය ගැන තොරතුරු අපේ සෙල්ලිපිවල සඳහන් වන බව ලංකාවේ බුදු සමයේ ඉතිහාසය පොතේ දක්වා





තිබේ. පොදුවේ ගත්කළ හැම ආරාමයකම පාලන ක්‍රමයේ ඒකාකාරී තත්ත්වයක ස්පරූපයක් ගෙන තිබූ බව හතරවන මිහිඳු රජුගේ මිහින්තලා සෙල්ලිපියේ සඳහන් පුවතින් විස්තර කෙරේ. අනෙක් හැම විහාරයන්හි පැරණි සිරිත මෙම විහාරයෙහිද නියම කෙරෙන බව එහි සඳහන් වේ. හතරවන මිහිඳුගේ අභයගිරි ශිලා ලිපියෙහි සඳහන් අයුරු පිරිවෙන් ලද්දන් ඉතා උසස් තැනක වැජඹී ඇති බව පෙනේ. ලාභ ලද්දා වූ සංඝයා රජයෙන් හෝ දායකයන්ගෙන් සැදුම් ලද කමිටු විසින් එකී ස්ථානයේ ප්‍රධානීන් ලෙස පත්කර තිබේ.

**පූජ්‍ය වෙලේගම්මැද්දේ ශ්‍රී විමලජෝති හිමි**